වාර්ෂික වාර්තාව 2019

வருடாந்த அறிக்கை 2019

Annual Report 2019



සීමාසහිත සීනෝර් පදනම

வரையறுக்கப்பட்ட சீநோர் நிறுவனம்

CeyNor Foundation Limited

වාර්ෂික වාර්තාව

2019

සීමාසහිත සීනෝර් පදනම

නො. 335, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10

(ජීවර රාජ්‍ය අමාත්‍යාංශය.)

අන්තර්ගතය

පිටු අංක

ආයතනික තොරතුරු 3-5

දැක්ම, මෙහෙවර සහ අරමුණු 6

හැඳින්වීම 7

සභාපතිතුමාගේ සමාලෝචනය 8-9

අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව 10-11

2019 වර්ෂය තුල ලබාගත් ජයග්‍රහණ 12-13

2019 වර්ෂයේ මූල්‍ය කාර්යය සාධනය 14

නිෂ්පාදන වර්ගීකරණ 15-20

අනාගත සැලසුම් 21-23

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව 24-35

මූල්‍ය ප්‍රකාශන 36-63

ආයතනික තොරතුරු

- **සමාගමේ නම සහ ලිපිනය**

  සීමාසහිත සිනෝර් පදනම
  නො: 335, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10

- **නෛතික පසුබිම**

  1982 අංක 17 දරණ සමාගම් පනතට හා අනතුරුව 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුල සංස්ථාගත කල සමාගමකි.

- **අධ්‍යක්ෂ මණ්ඩලය**

එම්. එච්. කේ. පරණවිතාන මයා	-	සභාපති
අයේෂ් රණවක මයා	-	කළමනාකාර අධ්‍යක්ෂ
කේ. ඒ. එස්. එස්. කේ. පෙරේරා මයා	-	අධ්‍යක්ෂ (මහා භාණ්ඩාගාර නියෝජිත)
කේ. ඒ. සරත් චමින්ද මයා	-	අධ්‍යක්ෂ
වයි. ජී. ජනක ද සිල්වා මයා	-	අධ්‍යක්ෂ
නිහාල් එදිරිසිංහ මයා	-	අධ්‍යක්ෂ
ඒ. එල්. පී. රූපසිංහ මයා	-	අධ්‍යක්ෂ

- **සමාගම් ලේකම්**

  ආනන්ද සිරිසේන සහ සමාගම,
  නො. 70/2/3B/ දෙවන මහල,
  වයි. එම්. බී. ඒ. ගොඩනැගිල්ල,
  ඩී. එස්. සේනානායක මාවත,
  බොරැල්ල.

- **විගණකවරු**

  විගණකාධිපති දෙපාර්තමේන්තුව,
  අංක 306/72, පොල්දූව පාර,
  බත්තරමුල්ල.

- **බැංකුකරුවෝ**

  ලංකා බැංකුව,
  ආයතනික ශාඛාව,
  කොළඹ 01.

  හැටන් නැෂනල් බැංකුව,
  නගර ශාඛාව,
  කොළඹ 01.

  මහජන බැංකුව,
  රැජින ශාඛාව,
  කොළඹ 10.

- **බෝට්ටු යාත්‍රාංගන**

මට්ටක්කුලිය බෝට්ටු යාත්‍රාංගනය,
නො. 25, හැඳල තොටුපල පාර,
මට්ටක්කුලිය,
කොළඹ 15.

මට්ටක්කුලිය බෝට්ටු යාත්‍රාංගනය, (කැළණි ගග අසබඩ)
නො. 135, හැඳල තොටුපල පාර,
මට්ටක්කුලිය,
කොළඹ 15.

සීනෝර් බෝට්ටු යාත්‍රාංගනය,
කරෙනගර්.

- **ISO තත්ත්ව සහතිකය**

2009 වර්ෂයේ සිට බෝට්ටු නිෂ්පාදනය පිළබඳ ISO 9001 – 2015 තත්ත්ව සහතිකය පිරිනමන ලද රාජ්‍ය සමාගමකි.

- **හවුල් ව්‍යාපාර**

සීනෝර් ඔරියන්ට් මුහුදු කෑම අවන්හල, නො. 335, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10.	- සීමාසහිත සීනෝර් පදනම සහ සීනෝර් ඔරියන්ට් පර්ල් සමාගම සමග අවුරුදු 20 කට අදාලව පැවැති හවුල් ගිවිසුම 2018.07.04 වන දිනෙන් අවසන් විය. ගිවිසුම්කාර පාර්ශවය විසින් Writ 226/2018 අංක ඇතිව අභියාචනාධිකරණයේ පවරන ලද නඩුව මේ වන විට විභාග වෙමින් පවතී.
මත්තුමගල කාර්මික වැඩහල, නො. 31 A, ගල් උඩුපිට පාර, මත්තුමගල	- සීමාසහිත සීනෝර් පදනම සහ ෆ්‍රොන්ටියර් ඔටෝ මෝටිව් පුද්ගලික සමාගම සමග 2006 අගෝස්තු මස 17 වන දින සිට 2021 අගෝස්තු මස 16 වන දින දක්වා අවුරුදු 15 ක කාල සීමාවක් සඳහා ව්‍යාපාරයෙහි ලාභ බෙදා ගැනීමේ සහ මාසිකව කුලියක් ලබා දීමේ පදනම මත අත්සන් කරන ලද කළමනාකරණ ගිවිසුමක් යටතේ ක්‍රියාත්මක වේ.

සීනෝර් පදනම සතු වර්ග අඩි 25,000 කින් යුත් ගබඩා සංකීර්ණය,
නො. 25, හැඳල තොටුපොල පාර,
මට්ටක්කුලිය,
කොළඹ 15.

-

සීමාසහිත සීනෝර් පදනම අන්වරලි ඇන්ඩ් සන්ස් පුද්ගලික සමාගම සමග 2017 පෙබරවාරි මස 08 වන දින සිට 2022 පෙබරවාරි මස 08 වන දින දක්වා අවුරුදු 05 ක කාල සීමාවකට මාසික කුලී පදනම මත ලබා දී ඇත.

දැක්ම, මෙහෙවර, අරමුණු

- **දැක්ම**

  ශ්‍රී ලංකාව තුළ ධීවර යාත්‍රා සහ විනෝද යාත්‍රා නිෂ්පාදනයේ මෙන්ම අනෙකුත් ෆයිබර්ග්ලාස් ආශ්‍රිත නිෂ්පාදන වල ප්‍රමුඛයා පවට පත් වීම හා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් යාත්‍රා නිෂ්පාදකයෙකු බවට පත් වීම.

- **මෙහෙවර**

  තරඟකාරී මිල ගණන් යටතේ ඉහළ ප්‍රමිතියකින් යුතු ධීවර යාත්‍රා සහ ධීවර ආම්පන්න සපයන කාර්යක්ෂම හා ඵළදායී ආයතනයක් ලෙස කටයුතු කිරීම.

- **අරමුණු**

  - ෆයිබර්ග්ලාස් බෝට්ටු අපනයනයේ පිළිගත් අපනයනකරුවෙකු බවට පත්වීම.
  - ජාත්‍යන්තරයේ කීර්තිමත් ෆයිබර්ග්ලාස් බෝට්ටු නිෂ්පාදකයෙකු බවට පත්වීම.
  - විදේශ රටවල් තුළ ෆයිබර්ග්ලාස් බෝට්ටු නිෂ්පාදනයේ ආයෝජිතයෙකු බවට පත්වීම.
  - විශිෂ්ඨ පාරිභෝගික සේවා සපයන්නෙකු වීම.
  - ඉහළ ප්‍රමිතියකින් යුතු ධීවර බෝට්ටු සහ ධීවර ආම්පන්න සැපයීම තුළින් ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීමේ වඩාත් ඵළදායී අනුග්‍රාහකයෙකු වීම.

හැඳින්වීම

ශ්‍රී ලාංකීය ධීවර ප්‍රජාවගේ අධ්‍යාපන සහ සුභ සාධක කටයුතු ඉහළ නැංවීමේ අරමුණින් 1967 නෝර්වේජියානු රාජ්‍ය නොවන සංවිධානයක ආධාර මත ලාභ අරමුණු කර නොගත් රාජ්‍ය නොවන සංවිධානයක් ලෙස සීනෝර් සංවර්ධන පදනම ආරම්භ කරන ලදී. අනතුරුව 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ රජයට පවරාගත් වෙළඳ ව්‍යාපාර පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත යටතේ සීනෝර් සංවර්ධන පදනම **"සීමාසහිත සීනෝර් පදනම"** ලෙස සංස්ථාගත කර ඇත. ආරම්භයේ සිට කාලයාගේ ඇවෑමෙන් මෙම සංවිධාන ව්‍යුහයෙහි සිදු වූ වෙනස්කම් පහත පරිදි දක්වා ඇත.

1967 නෝර්වේජියානු රාජ්‍ය නොවන සංවිධානයක් වන නෝර්වේ ගොඩිටෙම්ප්ලර් උන්ග්ඩෝම්ස් පෙර්බන්ඩ් වෙතින් ලත් ආධාර ප්‍රයෝජනයට ගනිමින් සීනෝර් සංවර්ධන පදනම පිහිටුවා එහි කටයුතු ඇරඹීය.

1971 1938 අංක 51 දරණ සමාගම් ආඥා පනත යටතේ ඇපයෙන් සීමිත පොදු සමාගමක් ලෙස සංස්ථාගත කොට සීමාසහිත සීනෝර් සංවර්ධන පදනම යන නමින් හැඳින්වීය.

1985 ශ්‍රී ලංකා රජය විසින් 1971 අංක 35 දරණ වෙළඳ ව්‍යාපාර පවරා ගැනීමේ පනත යටතේ රජයට පවරාගත් අතර රජයට පවරාගත් සීමාසහිත සීනෝර් සංවර්ධන පදනම නමින් හැඳින්වීය.

1990 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ රජයට පවරාගත් වෙළඳ ව්‍යාපාර පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත ක්‍රියාත්මක වීමෙන් රජයට පවරාගත් සීමාසහිත සීනෝර් සංවර්ධන පදනම අහෝසි වී එහි අනුප්‍රාප්තිකයා ලෙස කටයුතු කිරීමට 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ 1990.01.17 වන දින සීමාසහිත සීනෝර් පදනම සංස්ථාගත කරනු ලැබ ඇත.

මෙම නව සමාගමේ සම්පූර්ණ කොටස් ප්‍රාග්ධනය (රු. 40,000,000/-) භාණ්ඩාගාරයේ ලේකම් වෙත වෙන් කර ඇත.

2011 අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සහිතව රජය විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණයකට අනුව සීමාසහිත සීනෝර් පදනම යටතේ පැවැති ලුණුවිල සහ වීරවිල මාළුදැල් කර්මාන්ත ශාලා දෙක 2011 නොවැම්බර් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන යාම සඳහා සීමාසහිත නෝර්ත් සී ආයතනයට පවරා දී ඇති අතර නෝර්ත් සී ආයතනය යටතේ පැවැති යුද්ධයෙන් විනාශ වූ කරෛනගර් බෝට්ටු යාත්‍රාංගනය සීනෝර් පදනම වෙත පවරා දී ඇත.

2013 දික්ඕවිට ධීවර වරාය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට සමගාමීව සියලුම ධීවර සහ විනෝද යාත්‍රා නිෂ්පාදනය සඳහා මට්ටක්කුලිය යාත්‍රාංගනය වැඩි දියුණු කිරීම.

සභාපතිතුමාගේ සමාලෝචනය

සීමාසහිත සීනෝර් පදනමේ අභිවෘද්ධිය සඳහා අප විසින් 2018 වර්ෂයේ ආරම්භ කරන ලද ව්‍යාපෘතිවල සාර්ථකත්වය සහ එමගින් අත්පත් කරගත් ප්‍රතිඵල මූලික කොටගෙන අප විසින් සිදු කරන ලද ධීවර යාත්‍රා සහ ඒ ආශ්‍රිත උපකරණ නිෂ්පාදනය 2019 වර්ෂය සඳහා ද එලෙසම පවත්වාගෙන යමින් සාර්ථකව නිම කරන ලද 2019 වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂයේ වාර්ෂික වාර්තාව සීනෝර් පදනමේ සභාපතිවරයා ලෙස ඉතාමත් සංතෝෂයෙන් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරමි.

ධීවර ජන සමාජය මුහුණදෙන ප්‍රධාන ගැටළුවක් වන, ඔවුන් විසින් නෙළාගන්නා මත්ස්‍ය අස්වැන්නෙහි පසු අස්වනු නාස්තිය අවම කිරීමේ අරමුණින් 2016 වර්ෂයේදී ආරම්භ කරන ලද සියළු නවීන උපාංග වලින් සමන්විත බහුදින ධීවර යාත්‍රා තුනක නිෂ්පාදන කටයුතු සාර්ථකව නිම කරමින් ධීවරයන් වෙත ලබා දීමට 2019 වර්ෂය තුලදී හැකියාව ලැබුණු බව දැනුම්දීමට කැමැත්තෙමි. මීට අමතරව ඊට අදාලව අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව ප්‍රතිලාභීන්ගේ කැමැත්ත මත ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් තෝරා ගන්නා ලද පෞද්ගලික යාත්‍රාංගන වල නිෂ්පාදනය කළ යාත්‍රා 01 ක්, සීනෝර් ආයතනයේ අධීක්ෂණය යටතේ සිදු කර ධීවර ජනතාව අතට පත් කිරීමට 2019 වර්ෂයේදී හැකියාව ලැබුණි.

දිගු කාලයක් පුරා ආයතනිකමය වශයෙන් අඩුපාඩුවක්ව පැවැති දිගු කාලීන සැලසුම් සිදු කරමින් සංයුක්ත සැලැස්ම පිළියෙල කර ආයතනයේ අනාගත ගමන් මග පිළිබඳ පැහැදිලි දිශානතියක් ඇති කිරීමට හැකියාව ලැබුණි.

2019 වර්ෂයේ පිළිවෙලින් රු. මි. 58.178, රු. මි. 30.61, රු. මි. 35.225 යනාදී ආයතනික නිෂ්පාදන, අනෙකුත් මෙහෙයුම් සහ භාණ්ඩ මිලදී ගෙන විකිණීම හරහා රු. මි. 124.014 ක දළ ආදායමක් ලැබුවද වර්ෂ අවසානයේදී අපේක්ෂිත අරමුණ වූ ලාභ ඉපයීමක් සිදු කර ගැනීමට නොහැකි විය. ඒ අනුව 2019 වසරේ බදු පසු ශුද්ධ අලාභය රු. මි. 23.774 කි.

මෙසේ අලාභ ලැබුවද ධීවර ජනතාවට ඉහළ සේවයක් ඉටු කරමින් පහතින් දැක්වෙන නිෂ්පාදන ඔස්සේ ධීවර ක්ෂේත්‍රයේ දියුණුව වෙනුවෙන් සීනෝර් ආයතනය කටයුතු කර ඇත.

- අනුරාධපුර පළාත් සභාව, දකුණු පළාත් සභාව සඳහා රු. මි. 10 කට අධික ඔරු, කොල්ලෑ, දැල් නිෂ්පාදනය කර ලබා දීම.
- 50% සහනාධාර මත අඩි 59.5 ක් දිගැති බහුදින ධීවර යාත්‍රාවක් නිෂ්පාදනය කර ලබා දීම.
- සංචාරක ක්ෂේත්‍රය වඩාත් ශක්තිමත් කිරීමේ අරමුණින් තල්මසුන් නැරඹීමේ යාත්‍රා 01 ක් මිරිස්ස ප්‍රදේශයේ ගැණුම්කරුවන් සඳහා නිෂ්පාදනය කර ලබා දීම.

තවද 2018 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාවේ සඳහන් කොට ඇති අපගේ පද්ධති හා පාලන වල පවතින දුර්වලතා නිවැරදි කිරීමට 2019 වර්ෂය තුලදී කටයුතු කර ඇති බවද දන්වා සිටිමි.

2019 වර්ෂය තුලදී අප සමාගමෙහි සියලු අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මග පෙන්වූ ගරු ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය විජිත් විජිතමුණි සොයිසා මැතිතුමාට සහ එම අමාත්‍යාශයේ ලේකම්තුමාටත්, අමාත්‍යාංශයේ සේවක මඩුල්ලටත් මාගේ ස්තූතිය පල කර සිටිමි. තවද ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ එම දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයටද මාගේ ස්තූතිය පිරිනමමි. අපහට ලබා දෙන ලද සියලු කාර්යයන් 2019 වර්ෂයේදී සාක්ෂාත් කර ගැනීමට නොමද සහායක් ලබා දුන් සීනෝර් පදනමෙහි කළමනාකාර අධ්‍යක්ෂක ඇතුළු අධ්‍යක්ෂක මණ්ඩලයටත්, සාමාන්‍යාධිකාරීතුමා ඇතුළු සේවක මණ්ඩලයට ද මාගේ ස්තූතිය පුද කරමි.

.....

ඒ. පී. රාජ් චන්ද්‍රලාල්
ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික)
වර්තමාන සභාපති
සීමාසහිත සීනෝර් පදනම

අත්සන් කළේ:-
එම්. එච්. කේ. පරණවිතාන
හිටපු සභාපති
සීමාසහිත සීනෝර් පදනම

2019 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

01. විගණනය කරන ලද ගිණුම්

2019 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කර ඇත.

02. මූල්‍ය ප්‍රතිඵල

වර්ෂයේ ශුද්ධ ලාභය / (අලාභය) පිටු අංක 42 හි සමස්ථ ආදායම පිළිබඳ ප්‍රකාශනයෙහි දක්වා ඇත.

03. පවත්නා තත්ත්වය

සමාගමේ පවත්නා තත්ත්වය පිටු අංක 43 හි දක්වා ඇත.

04. මූලික මෙහෙයුම් කාර්යයන්

2019 වර්ෂයෙහි සමාගමේ මූලික මෙහෙයුම් කාර්යයන් පහත පරිදි දැක්වේ.

- සියලු පහසුකම් වලින් සමන්විත ෆයිබර්ග්ලාස් බහුදින ධීවර යාත්‍රා නිෂ්පාදනය.
- ධීවර කර්මාන්තය සඳහා අවශ්‍ය මාළු පෙට්ටි, අලෙවි කුටි සහ ආරක්ෂක කුටි නිෂ්පාදනය කිරීම.
- මිරිදිය ධීවර කර්මාන්තයට අවශ්‍ය ඔරු සහ කොල්ලෑ නිෂ්පාදනය කිරීම.
- ධීවර ක්ෂේත්‍රයට අවශ්‍ය මාළු දැල් සහ ඒ ආශ්‍රිත උපකරණ මිලදී ගැනීම සහ විකිණීම් කටයුතු සිදු කිරීම.
- සංචාරක ක්ෂේත්‍රයට අවශ්‍ය විනෝද යාත්‍රා සහ තල්මසුන් නැරඹීමේ යාත්‍රා නිෂ්පාදනය කිරීම.

05. ලාභාංශ

2019 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලාභාංශ ප්‍රකාශ කර නොමැත.

06. සමාගම සමග යෝජිත කොන්ත්‍රාත් සම්බන්ධයෙන් අධ්‍යක්ෂකවරුන්ගේ සබැඳියාව

2019 වර්ෂය තුළ සමාගමේ අධ්‍යක්ෂකවරුන් සමග කොන්ත්‍රාත් සබැඳියාවක් නොමැත.

07. සමාගමේ කොටස් සම්බන්ධයෙන් අධ්‍යක්ෂකවරුන්ගේ සබැඳියාව

2019 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා අධ්‍යක්ෂකවරයෙකු සතු වූ කොටස් නොමැත.

08. ප්‍රමාණාත්මක කොටස් හිමිකම

ශේෂපත්‍ර දිනට සමාගමේ නිකුත් කල කොටස් ප්‍රාග්ධනයෙන් 100% ක් මහාභාණ්ඩාගාරයේ ලේකම් සතුව පවතී.

09. පුණ්‍යායතනයන්ට ආධාර කිරීම්

2019 වර්ෂය තුළදී සමාගම විසින් කිසිම පුණ්‍යාධාර ආයතනයකට හෝ දේශපාලන කරුණු සඳහා කිසිම දායකත්වයක් සපයා නොමැත.

10. දේපළ පිරියත හා යන්ත්‍රෝපකරණ වල වෙනස්වීම්

පිටු අංක 57 හි, උපලේඛනයේ දක්වා ඇති පරිදි දේපළ පිරියත හා යන්ත්‍රෝපකරණ සංචලනය වී ඇත.

11. බැංකු පහසුකම්

වර්ෂය ආරම්භයේ සිට මේ දක්වා සමාගම සතු බැංකු පහසුකම් අවශ්‍යතා අඛණ්ඩව සපයන සමාගමේ බැංකුකරුවන් ආරක්ෂිත ඇපකර මත තවදුරටත් මෙම පහසුකම් කරන බව විශ්වාස කර ඇත.

12. විගණකවරුන් පත් කිරීම

19 වන ව්‍යවස්ථා සංශෝධනය යටතේ සීමාසහිත සීනෝර් පදනම විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණනයට යටත් වේ.

13. මානව සම්පත

2019 දෙසැම්බර් 31 වන දිනට සීමාසහිත සීනෝර් පදනමෙහි මුළු සේවක මඩුල්ල පහත පරිදි වේ.

01. ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්	-	-
02. කළමනාකරුවන්	-	05
03. කණිෂ්ඨ කළමනාකරුවන්	-	02
04. කළමනාකාර සහකාරවරුන්	-	24
05. ප්‍රථමික ශිල්පීය හා ශිල්පීය නොවන සේවකයින්	-	42

14. 2019 දෙසැම්බර් 31 වන දිනට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය

එම්. එච්. කේ. පරණවිතාන මයා	-	සභාපති
අයේෂ් රණවක මයා	-	කළමනාකාර අධ්‍යක්ෂ
කේ. ඒ. එස්. එස්. කේ. පෙරේරා මයා	-	අධ්‍යක්ෂ (මහා භාණ්ඩාගාර නියෝජිත)
කේ. ඒ. සරත් චමින්ද මයා	-	අධ්‍යක්ෂ
වයි. ජී. ජනක ද සිල්වා මයා	-	අධ්‍යක්ෂ
නිහාල් එදිරිසිංහ මයා	-	අධ්‍යක්ෂ
ඒ. එල්. පී. රූපසිංහ මයා	-	අධ්‍යක්ෂ

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි

.....

ඒ. පී. රාජ් චන්ද්‍රලාල්
ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික)
වර්තමාන සභාපති
සීමාසහිත සීනෝර් පදනම

අත්සන් කළේ:-
එම්. එච්. කේ. පරණවිතාන
හිටපු සභාපති
සීමාසහිත සීනෝර් පදනම

.....
Director, Amerada Sirisena & Co. (Pvt.) Ltd. (PV63581)
Registered Secretaries SEC/(2)2008/214

ආනන්ද සිරිසේන සමාගම
සමාගමේ ලේකම්

2019 වර්ෂය තුළදී ලබාගත් ජයග්‍රහණ

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක අංක 14 "Life below water" යටතේ ක්‍රියාත්මක වෙමින් ෆයිබර්ග්ලාස් ධීවර යාත්‍රා,විනෝද යාත්‍රා, පැඩල් බෝට්ටු මෙන්ම අනෙකුත් ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදන වන ආරක්ෂක කුටි, ජංගම වැසිකිලි, කාර්යාල කාමර ආදී වූ විවිධාංගීකරණය වූ ගුණාත්මකභාවයෙන් යුතු නිෂ්පාදන මෙම වර්ෂය තුළදී සිදු කර ඇත. පසු අස්වනු නාස්තිය අවම කිරීම සඳහා සීනෝර් පදනම විසින් නිෂ්පාදනය කරනු ලබන අඩි 59.5ක් දිගැති බහුදින ධීවර යාත්‍රාවක් මෙම වර්ෂය තුළදී ද අදාළ ප්‍රතිලාභී හිමිකරුවෙකුට නිෂ්පාදනය කර ලබා දී ඇත. යාවත්කාලීන වූ අභ්‍යන්තර නිර්මාණ අංග උපාංග හා උපකරණ ඇතුළත් කර සකස් කරන ලද අඩි 50 නිල් තල්මසුන් නැරඹීමේ යාත්‍රාවක් ගනුදෙනුකරුට මෙම වර්ෂය තුලදී ලබා දුන් අතර එම නිල්තල් මසුන් නැරඹීමේ යාත්‍රාව සඳහා මිරිස්ස ධීවර වරාය තුළ ඉහළ ඉල්ලුමක්ලැබුණි.





එමෙන්ම අනුරාධපුර පළාත් සභාව, දකුණු පළාත් සභාව සඳහා රුපියල් මිලියන 10 ට අධික ඔරු, කොල්ලෑ සහ දැල් ඇණවුම් සඳහා නිෂ්පාදන සිදු කරන ලද අතර නගර සභාව, වෙල්වතුරෙයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා ජංගම වැසිකිලි නිෂ්පාදනය කර ඇති අතර වවුනියාව නගර සභාව සඳහා පැඩල් බෝට්ටු ඇණවුමක් ද නිෂ්පාදනය කර ඇත. ධීවර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන සහෝදර ආයතන වන NARA සහ NAQDA ආයතන වෙත හැවරි ටැංකි සහ හැවරි ජා මෙම වර්ෂයේදී නිෂ්පාදනය කර බෙදා හැර ඇත.







ඉහත සඳහන් කරුණු වලට අමතරව 2019 වර්ෂය තුළ දී අප සමාගම විසින් නිෂ්පාදනය කරන ලද සියලු භාණ්ඩ වල සවිස්තරාත්මක විස්තරයක් පහත වගුවේ දක්වා ඇත.

අංකය	නිෂ්පාදන වර්ගය	ප්‍රමාණය
1.	සෂිමි යාත්‍රා	01
2.	අඩි 19 ½ පතුල පැතලි ඔරු	01
3.	ඔරු	350
4.	ෆයිබර්ග්ලාස් හැවරි ජා	50
5.	ෆයිබර්ග්ලාස් පාවෙන පාලම/ මගී පාලම	03
6.	කොල්ලෑ	362
7.	හබල	02
8.	පැඩ්ල් බෝට්ටු	06
9.	බහුදින යාත්‍රා (අඩි 55 සහ අඩි 59.5)	01
10.	ෆයිබර්ග්ලාස් මාළු පෙට්ටි	31
11.	අයිස් පෙට්ටි	29
12.	විනෝද යාත්‍රා	01
13.	ෆයිබර්ග්ලාස් යාත්‍රා (අඩි 13/ අඩි 18.5)	38
14.	ලයිව් ටෑන්ක්ස්	02
15.	මාළු බකට්	15
16.	ෆයිබර් ටෑන්ක්	10
17.	ආරක්ෂක කුටි	01
18.	ෆයිබර්ග්ලාස් කාර්යාල කුටි	01
එකතුව		**904**

2019 වර්ෂයේ මූල්‍ය කාර්යය සාධනය

සීමාසහිත සීනෝර් පදනම 2019 මුදල් වර්ෂය අවසානය දක්වා රුපියල් මිලියන 23.7 ක බදු පසු අලාභයක් උපයමින් ඉතා සාර්ථකව කළමනාකරණය කර ඇත. 2019 වර්ෂයේදී මෙම ලාභය අත්පත් කර ගැනීම සඳහා ධීවර අමාත්‍යාංශය මගින් ලබා දෙන ලද ඇණවුම් මෙන්ම අනෙකුත් රාජ්‍ය සහ පෞද්ගලික ආයතන මගින් ලබා දෙන ලද ඇණවුම් බෙහෙවින් දායක වී ඇත.

අනු අංකය	විස්තරය	පිරිවැටුම
01	සමාගමේ නිෂ්පාදන මගින් ලැබූ ආදායම	රු. 58,178,458.05
02	අනෙකුත් මෙහෙයුම් ආදායම	රු. 30,610,822.05
03	මිලදී ගැනීම් සහ විකිණීම මගින් ලැබූ ආදායම	රු. 35,225,223.98
මුළු ආදායම		**රු. 124,014,504.10**

වගුව 4

පසුගිය වසර 3 තුල කැපී පෙනෙන මූල්‍ය තත්ත්වයන් 321,674,585.98

විස්තරය	2017	2018	2019
මුළු ආදායම	1060.63	263.91	124.01
දළ ලාභය (අලාභය)	170.56	19.35	5.77
ශුද්ධ ලාභය (අලාභය) බදු වලට පසු	89.35	(54.68)	(23.77)
කොටසක ඉපයීම	22.34	(13.67)	(5.94)
ස්ථාවර වත්කම් (ශුද්ධ පොත් අගය)	346.42	321.67	430.24
ස්ථාවර තැන්පත්	1.30	12.00	12.00
ජංගම වත්කම්	445.25	205.4	206.7
ජංගම වගකීම්	431.48	117.6	139.6
ජංගම නොවන වගකීම්	41.25	35.05	173.4
කොටස් ප්‍රාග්ධනය	40.00	40.00	40.00
අනෙකුත් සංචිත සමග ප්‍රාග්ධනය	320.91	349.6	325.9

නිෂ්පාදන වර්ගීකරණ

59.5 ft Long Line Multiday Fishing Boat



Specification

Length	18m
Beam	5.20m
Draft	1.60m
Fuel	14000l
Water	4500l
Fish hold capacity	45.0cu.m
Engine capacity	410 hp

LKR 35 M ($ 172,567)

Long Line Multiday Fishing Boat (55ft)



Specification

Length	16.764m
Beam	5.03m
Draft	1.8m - 2.05m
Fish hold capacity	29m3 - 35m3
Fuel	10,000-14000l
Water	5,000-6000l
Speed	9kmph
Engine capacity	320 -410 hp

LKR 33M ($ 162,706)

Trimaran – Whale Watching Boat (50ft)



LKR 28 M ($ 138,053)

Specification

Length	15.24m
Beam	5.30m
Draft	1.05m
Main Hull Beam	2.30m
Fuel	2,400l - 3,000l
Water	1000 -1500l
Seating Capacity	5.30m
Speed	9-11 kmph
Beds	01
Fish hold capacity	01
Engine capacity	250hp

Ambulance Boat (32ft) – without engine



LKR 12 M ($ 59,166)

Specification

Length	32ft 3in
Beam	10ft 2in
Draft	3ft
Fuel	750l
Cupboard	3
Water	150l
Oxygen cylinder holder	02
Hooks for seyline bottle	02
Seats	03
Bench for 4 people	01
Sink and water tap	01
Cloth hanger 01	
Empty box first aid	01
Emergency ladder s/s	01
Rexin covered mattress for beds	02
Toilet with water	01

Leisure Boat (24ft) – without engine



Specification

Length	7.3m
Beam	2.24
Depth	0.16m
Draft	0.45m

SS canopy with sunbrella cloth

LKR 03 M ($ 14,791)

Flat Bottom Boat (18 1/2ft - 19 1/2ft) – without engine



Specification

Length	18ft 5in - 19ft 6in
Beam	6ft 5in - 6ft 6in
Depth	2ft 6in - 2ft 9in
Draft	5in

Slow board winch SS canopy with sunbrella cloth

LKR 360,000/- ($ 1,775)

13ft – 19ft CeyNor-Genso Solar Boat



LKR 950,000/- ($ 4,684)

Fiberglass 18 ½ feet and 15 ½ feet



18 ½ Feet - LKR 88,000/- ($434)

15 ½ Feet - LKR 85,000/- ($419)

Paddle Boat





Specification

Length	7ft 8in
Beam	5ft 1in
Depth at mid	1ft
Seating capacity	02 person
Canopy with sunbrella cloth	01

LKR 375,000/- ($ 1,850)

Fish Stall



LKR 340,000/- ($1,676)

Specification

Length	72in
Width	48in
Height	84in
Ice box	36in x 18in x 24in
Fish display tray	02
Swing doors	02

New design for House Boat/Floating Restaurant



Specification

Overall Length	36'
Beam	18'-8'
Draft	0.2m

Options

Mini Bar
Kitchen/ Open Pantry
Toilets/Changing Room/Bath room
Tables
Chairs
Solar roof



LKR 16,000,000/- ($ 78,888)

Mobile Toilet (double)	**LKR 350,000/- ($ 2406)**
Security Hut	**LKR 430,000/- ($ 2,120)**
Fish Keeping Ice Box	**LKR 25,000- 220,000 ($ 123-1085)**
Fish Pallet	**LKR 28,000/- ($ 138)**
Life Ring	**LKR 8,000/- ($ 39)**
Life Jacket	**LKR 4,000/- ($ 19.7)**


25 5 2006







සීනෝර් පදනමෙහි අනාගත සැලසුම්


01. එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්ක "අංක 14" ට අනුගත වීම.



සීනෝර් පදනමෙහි ප්‍රධානතම අරමුණක් වන්නේ ජාත්‍යන්තර වෙළඳපල ඉලක්ක කරගත් නවෝත්පාදන හඳුන්වාදීමයි. එහි ප්‍රථම පියවර ලෙස වත්මන් රජයේ ප්‍රධානතම තේමාව වන එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්ක යටතේ, අංක 14 "නීල ආර්ථික" සංකල්පයට අනුගත වෙමින් පදනමේ කටයුතු සැලසුම් කරමින් පවතී.


02. "CeyNor Tower" ව්‍යාපෘතිය.

ශ්‍රී ලංකාව තුළ ජාතික සමුද්‍රීය මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කිරීමට අපේක්ෂිත "CeyNor Tower" ව්‍යාපෘතියේ වැඩකටයුතු එළඹෙන වර්ෂයේදී ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. විශේෂයෙන්ම සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීමේ අරමුණින් රට තුළ පිහිටා ඇති සියළුම සමුද්‍රීය ආයතන එක් ස්ථානයකට කේන්ද්‍රගත කිරීම මෙහිදී සිදුවනු ඇත. ජාතික සමුද්‍රීය මධ්‍යස්ථානයට අමතරව, සියළුම රාජ්‍ය හා පෞද්ගලික සමුද්‍රීය ආයතනශාඛා, ආපනශාලා, සමාජශාලා, හෝටල් සංකීර්ණ, අති නවීන පහසුකම් සහිත රැස්වීම්ශාලා සහ සාප්පු සංකීර්ණ ආදී විවිධාංග රාශියකින් මෙය සමන්විත වේ.



03. සීනෝර් සමුද්‍රීය සන්නිවේදන පද්ධතිය.

සිය කර්මාන්තයන් සඳහා දින ගණනාවක් සාගරය මැද දිවි ගෙවන ධීවර ජනතාව හා ඔවුන්ගේ පවුල් අතර නොබිඳෙන සබඳතාවයක් පවත්වා ගැනීම අරමුණු කර ගනිමින් මෙම සන්නිවේදන පද්ධතිය ක්‍රියාවට නැංවීමට සැලසුම් කෙරේ. මෙමගින් සෘජු හා වක්‍ර රැකියා රැසක් උත්පාදනය කිරීමටද අපේක්ෂිතය.






Voice Communication System & Trade App

04. සාගර අභ්‍යන්තරය නැරඹිය හැකි නව යාත්‍රාවක් නිපදවීම.


සීමාසහිත සීනෝර් පදනම ධීවර ක්ෂේත්‍රය කෙරෙහි පමණක් නොව විශාල ආදායමක් උත්පාදනය කරගත හැකි සංචාරක ක්ෂේත්‍රයෙහි අභිවෘද්ධිය උදෙසා සියදායකත්වය සපයනු ලබයි. තරුණ පරම්පරාව මෙකී ධීවර ක්ෂේත්‍රයෙහි හෝ සමුද්‍රාශ්‍රිත සංචාරක ක්ෂේත්‍රය තුළ රඳවාගැනීමේ අපේක්ෂාවෙන් නවෝත්පාදන තුළින් ජනිත කරන රැකියා අවස්ථා උචිත බව අපගේ විශ්වාසයයි. එබැවින්, ආවේණික වූ නවීන අංගෝපාංගයන් සහිත සාගර පතුළ නැරඹීමේ හැකියාව ඇති නව සංචාරක යාත්‍රාවක් නිෂ්පාදනය කිරීමට සීමාසහිත සීනෝර් පදනම සැලසුම් කර ඇත.

05. තෙල් සහ ජලය වෙන් කිරීමේ පද්ධතිය.

වගකීම් සහගත රාජ්‍ය ආයතනයක් වශයෙන් පරිසර පද්ධතිය සුරැකීම කෙරෙහි සීනෝර් පදනම දැඩි අවධානයක් යොමු කර ඇත. ඒ අනුව යාත්‍රා මගින් පිටවන තෙල් සාගරයට කාන්දු නොවීමේ පද්ධතියක් යාත්‍රා තුළ ස්ථාපිත කිරීමට සීනෝර් පදනම සැලසුම් කර ඇත.



Newly designed bilge system



Oil water separator



Bilge pump

14 – Speak to me

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. එෆ්එල්එස්/බී/සීඑන්එෆ්එල්/6/19/14

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2021 දෙසැම්බර් 14 දින

CEY-NOR FOUNDATION LTD.
15 DEC 2021
COLOMBO - 10

සීමාසහිත සීනෝර් පදනම
සභාපති කාර්යාලය
දිනය 2021.12.15
ලැබුණා

සභාපති
සීමාසහිත සීනෝර් පදනම

සීමාසහිත සීනෝර් පදනමේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.එන්.රණතුංග
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් :- ලේකම් - සිවර අමාත්‍යාංශය

ලේකම් - මුදල් අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306 72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

මගේ අංකය எனது இல. My No. } එන්එල්එස්/බී/සීඑන්එෆ්එල්/6/19/1 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2021 දෙසැම්බර් 10 දින

සභාපති

සීමාසහිත සීනෝර් පදනම

සීමාසහිත සීනෝර් පදනමේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සීමාසහිත සීනෝර් පදනමේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, පදනමේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) 2019 වර්ෂයේ දී එකතුව රු.2,989,209 ක්වූ මිලදී ගැණුම් 2020 වර්ෂයේ මිලදී ගැණුම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් 2019 වර්ෂයේ ගැණුම් රු.2,738,898 කින් ද, භාණ්ඩ හා සේවා බදු රු.250,311 කින් ද, ණයහිමි ශේෂය රු.2,989,209 කින් ද අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

(ආ) විකුණුම් අත්තිකාරම් ලැබීම්, විකුණුම් අත්තිකාරම් ගිණුමක බැර ලෙස සටහන් කරනු වෙනුවට ණයගැති ලෙජරයේ බැරට සටහන් කර තිබීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ණයගැති ශේෂය රු.38,452,338 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) අනෙකුත් ලැබිය යුතු ශේෂයෙහි ඇතුළත් 2007 සිට 2014 වර්ෂයන්ට අදාල රු.2,466,894 ක් වූ ආර්ථික සේවා ගාස්තු ශේෂය 2019 වර්ෂය වන විට ආදායම් බදු සඳහා හිලව් කිරීමේ කාලය ඉක්මවා ගොස් ඇති බැවින් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස කපා හැරීම වෙනුවට ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තු ගිණුමට හරකර තිබුණු හෙයින් ගෙවිය යුතු ශේෂය රු. 2,466,894 හා වර්ෂයේ අලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) පදනම විසින් 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට හා 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ පළමු කාර්තු 3 ට අදාළව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවන ලද පිළිවෙළින් රු.1,313,488 ක් හා රු.385,973 ක් වූ ආර්ථික සේවා ගාස්තු ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තු ගිණුමේ ඍණ ශේෂයක් ලෙස වාර්තා කර තිබුණු හෙයින් සහ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ 4 වන කාර්තුවට අදාළව ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තු රු.127,764 ක් ගිණුම්ගත කර නොතිබුණු බැවින් අනෙකුත් ගෙවිය යුතු ශේෂය රු.1,827,225 ක් අඩුවෙන් ගිණුම්ගත වී තිබුණි.

(ඉ) ණයගැතියන් තිදෙනෙකුගේ ශේෂ සනාථන හා පදනමේ පොත්වල දැක්වෙන ශේෂ අතර රු.5,647,537ක වෙනසක් ද, මූල්‍ය ප්‍රකාශවල දක්වා ඇති ණයහිමි ශේෂ 06ක හා ණය හිමි ශේෂ සනාථන අතර රු.947,092 ක වෙනසක් නිරීක්ෂණය වුවද එම වෙනස්කම්වලට හේතු විගණනයට ඉදිරිපත් කිරීමට පදනම අපොහොසත් විය.

(ඊ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නෝර්ත් සී සමාගම නමින් රු.26,294,662 ක ණයගැති ශේෂයක් දක්වා තිබූ අතර නෝර්ත් සී සමාගමේ 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල වෙළඳ ණයගැති යටතේ සී-නෝර් පදනම - යාපනය නමින් රු.5,320,788ක ශේෂයක් පමණක් දක්වා තිබුණද එම ශේෂයන් සඳහා වෙනසට හේතු හඳුනාගෙන නොතිබුණි. තවද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - SLFRS 9 හි 5.5 ඡේදය ප්‍රකාරව දිගුකාලයක් පැවති මෙම ශේෂය වෙනුවෙන් හානිකරණ අලාභ ද හඳුනාගෙන නොතිබුණි.

(උ) 2019 දෙසැම්බර් 31 දිනට බැංකු ගිණුම් 06ක ශේෂවල එකතුව රු.17,003,598ක් වුවද අදාළ බැංකු ගිණුම්වල ශේෂ වලට අදාළව මාසික බැංකු ප්‍රකාශන ද, 2019 දෙසැම්බර් මාසයට අදාල බැංකු සැසඳුම් ප්‍රකාශය ද, එම වටිනාකම සඳහා ශේෂ තහවුරු කිරීමේ ලිපි ද, රු.13,169,713ක් වූ ස්ථාවර තැන්පතුවට අදාල ස්ථාවර තැන්පතු සහතිකය ද විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් අදාළ ශේෂයන්හි පැවැත්ම හා නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකිවිය.

(උ) 2007, 2012 හා 2014 වර්ෂවල සිට පැවත එන රු.115,736ක් වූ ලැබිය යුතු ද්‍රව්‍ය අත්තිකාරම් සහ වර්ෂයන් තහවුරු කරගත නොහැකි එකතුව රු.1,941,584 ක්වූ අනෙකුත් ලැබිය යුතු ශේෂයන් සම්බන්ධයෙන් කිසිදු ලිඛිතමය සාක්ෂියක් පදනම සතුව නොතිබුණු අතර එම ශේෂයන් අයකර ගැනීම සඳහා ද කිසිදු ක්‍රියාමාර්ගයක් පදනම විසින් ගෙන නොතිබුණි. තවද මෙම ශේෂයන් වෙනුවෙන් අඩමාණ ණය සඳහා වෙන් කිරීමක් ද සිදුකර නොතිබුණි.

(ඵ) 2011 ඔක්තෝබර් 10 දින සීමාසහිත සී - නෝර් පදනම සහ නෝර්ත් සී ආයතනය අතර අත්සන් කර තිබුණු අවබෝධතා ගිවිසුමට අනුව ලුණුවිල ඇති සියලුම ඉඩම් හා ගොඩනැගිලි නෝර්ත් සී ආයතනය වෙත මාරු කළ යුතු බවට සඳහන්ව තිබූ කොන්දේසිය අනුව 2011 වර්ෂයේ දී රු.8,500,000 ක් වූ ඉඩම් වටිනාකමක් ගිණුම්වලින් ඉවත් කර තිබුණද අවබෝධතා ගිවිසුම හැර ඉඩම් පැවරීමට අදාල ඔප්පුවක් හෝ හුවමාරුවට අදාල වටිනාකමක් සහිත කිසිදු නෛතික ලියවිල්ලක් විගණනයට ඉදිරිපත් නොවීය.

(ඒ) සමාලෝචිත වර්ෂය තුල මට්ටක්කුලිය යාත්‍රාංගනය නිෂ්පාදනය කළ අයිතම සඳහා භාවිතා කළයුතු රෙසින් ප්‍රමාණය කි.ග්‍රෑම් 27291ක් වූ අතර යාත්‍රාංගන ලේඛනය අනුව භාවිතා කළ රෙසින් ප්‍රමාණය කි.ග්‍රෑම් 56057ක් වූයෙන් රු.9,833,369 ක්වූ රෙසින් කි.ග්‍රෑම් 28766ක් කුමන කටයුතු සඳහා භාවිතා කළේ ද යන්නට අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

(ඔ) වර්ෂ 03 සිට වර්ෂ 13 දක්වා ආපසු ගෙවිය යුතු එකතුව රු.2,110,317ක් වූ තැන්පතු සඳහා තැන්පත් කළ පුද්ගලයාගේ නම හැර කිසිදු තොරතුරක් පදනම සතුව නොතිබුණි. අදාල තැන්පතු ශේෂවල නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ඕ) 2018 වර්ෂයට පෙර සිට පැවත එන රු.1,119,030 ක ලැබිය යුතු රඳවා තබා ගැනීමේ බදු ශේෂය හා ව්‍යාපාරික ආයතන දෙකකින් ලද රු.728,550 ක කුලී ආදායම්වලට අදාල බදු සහතික හා කුලී ගිවිසුම් පදනම සතුව නොතිබීම හේතුවෙන් අදාල ශේෂයන්ගේ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට විගණනයේදී නොහැකි විය.

(ක) 2019 දෙසැම්බර් 31 දිනට මත්තුමගල ඉඩමෙහි ආයෝජන ආදායම් ලෙස රු.2,700,000 ක් දක්වා තිබුණ ද එවැනි ආයෝජන වත්කමක් මූල්‍ය ප්‍රකාශයේ දක්වා නොතිබුණි.

(ග) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01 හි 29 වන ඡේදය ප්‍රකාරව, පදනම සතු රු.73,136,262 ක් වටිනා ඉඩමක් බදුදීම සම්බන්ධයෙන් පුද්ගලික සමාගමක් සමඟ වූ බදු ගිවිසුමෙහි බදු කාල සීමාව 2018 ජූලි 03 දිනෙන් අවසන් වීමත්, එම පුද්ගලික සමාගම නැවත කුලී පදනම යටතේ එය ලබා ගැනීමට නඩුවක් පවරා තිබීමත් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ච) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 02 ප්‍රකාරව සංචලනය නොවන රු.6,350,696ක් වූ තොග සම්බන්ධයෙන් හානිකරණය සඳහා වෙන් කිරීම් සිදුකර නොතිබුණි.

(ඡ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 9 හි 5.5 ඡේදය ප්‍රකාරව දිගුකාලයක් ණයගැතියන් ලෙස පවතින ශේෂ වෙනුවෙන් හානිකරණ අලාභ හඳුනාගෙන කටයුතු කළ යුතු වුවත්, 2005 සිට 2016 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාල එකතුව රු.2,439,293ක් වූ ණයගැති ශේෂයක් සම්බන්ධයෙන් හානිකරණ අලාභ හඳුනාගෙන නොතිබුණි.

(ට) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 34 වන ඡේදය ප්‍රකාරව පදනමේ ප්‍රයෝජනයට ගන්නා ඉඩම් හා ගොඩනැගිලි 2009 වර්ෂයෙන් පසු ප්‍රත්‍යාගණනය කර 2019 දෙසැම්බර් 31 දිනට සාධාරණ වෙළඳ වටිනාකම අනුව ගිණුම්වලට සිදුකළ යුතු ගැලපීම් කර නොතිබුණි.

(ඩ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 හි ඡේද අංක 120 අ අනුව සේවක ප්‍රතිලාභ වෙන්කිරීම් ගණනය කිරීමට යොදා ගත යුතු මූලික මූලධර්ම වන සේවක ප්‍රතිලාභ වියදම්වලට අදාළ වර්තමාන සේවා පිරිවැය, වර්ෂයට අදාළ පොළී පිරිවැය හා උපකල්පන වෙනස් වීම නිසා ඇති වූ ආයුගණක ප්‍රතිලාභ/අලාභ වගකීම හෙළිදරව් කර නොතිබුණු අතර ඡේද අංක 93 අ අනුව උපකල්පන වෙනස් වීම නිසා ඇති වූ ආයුගණක ප්‍රතිලාභ/අලාභ වගකීම අනෙකුත් විස්තීර්ණ ආදායම තුළ හඳුනා ගෙන ද නොතිබුණි.

(ත) රු.1,961,850 ක ශ්‍රී බංගලාස් බෝට් බද්ධ ව්‍යාපාරයේ ආයෝජනය වෙනත් ගෙවිය යුතු ශේෂය තුළ හානිකරණ අලාභ ලෙස මුල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල ගිණුම්ගත කර තිබුණි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 36 ට අනුව හානිකරණයට යටත් වූ වත්කම්වල ධාරණ අගය මුල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල හෙළිදරව් කළයුතු වුවත් එසේ දක්වා නොතිබුණු බැවින් ආයෝජන ලෙස දක්වා තිබුණු ශ්‍රී බංගලාස් බෝට්වල ආයෝජන අගය වැඩියෙන් පෙන්නුම් කර තිබුණි.

(ද) රු.135,000,000 ක්වූ සීමාසහිත සීනෝර් ඔරියන්ට් පර්ල් සී ෆූඩ් අවන්හල පිහිටි රූඩ් 2 යි පර්චස් 12 ක් වූ ඉඩම හා රු.115,000,000 ක්වූ මට්ටක්කුලිය යාත්‍රාංගනයේ බදු දී ඇති වර්ග අඩි 25,000 ක ගබඩාව ප්‍රමිත 40 හි 75 හා 79 ඡේද ප්‍රකාරව ආයෝජන, වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කරනු වෙනුවට, දේපල පිරියත හා උපකරණ යටතේ දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය පදනම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, පදනමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මහහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පදනමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) (ඇ) වගන්තියේ සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා පදනම පවත්වාගෙන ගොස් තිබුණි.

- පදනමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පදනම ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (ආ), (ඊ), (උ), (ඡ), (ට), (ඩ), (ද), (ප) හා (ය) ඡේද හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පදනමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට පදනම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	විස්තරය
(අ) 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1(ඇ), 1.2.1(ඊ), 5.3.1(ඇ) හා 5.3.2 මාර්ගෝපදේශ	(i) මට්ටක්කුලිය යාත්‍රාංගනයේ නිෂ්පාදනයන් සඳහා රු.47,543,238 ක වටිනාකමැති අමුද්‍රව්‍ය ප්‍රසම්පාදනය සඳහා ජාතික තරඟකාරී ලංසු ඉදිරිපත් කිරීමේදී අවම වශයෙන් දින 21 ක කාලයක් ලබාදිය යුතු වුවත් ලබාදී තිබූ කාලය දින 14කට සීමාකර තිබුණි. (ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව ලංසු කැඳවීමේ ලේඛන වෙනුවට වෙනත් ලංසු ලේඛන භාවිතා කිරීමේදී තෘක්ෂණික ඇගයීම් කමිටුව සහ ප්‍රසම්පාදන කමිටුව පරීක්ෂා කර එම ලේඛන අනුමත කර නොතිබුණි.

		(iii) ලංසු කැඳවීමේ ආරාධනයෙහි ජයග්‍රාහී ලංසුකරුට තිබිය යුතු උපමාන සහ සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවලින් බැහැරව ලංසු ලේඛන සකස් කර තිබුණි.
(ආ)	2012 අගෝස්තු 08 දිනැති අංක 27 දරන පරිපුරකයෙන් සංශෝධිත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 (ආ) ඡේදය	තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා ප්‍රසම්පාදන අස්ථිත්වයේ නිලධාරීන් තිදෙනෙකු සහභාගි වී තිබුණු අතර විෂයය විශේෂඥයකු ද පත්කර නොතිබුණි.
(ඇ)	1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත (සංශෝධිත)	(i) කිසියම් මාසයක සේවක අර්ථ සාධක අරමුදලට දායක මුදල් ඊළඟ මාසයේ 15 දින හෝ ඊට පෙරදින ප්‍රේෂණය කළ යුවත් 2019 වර්ෂයේ නොවැම්බර් හා දෙසැම්බර් මාසවලට අදාලව එකතුව රු.1,071,030 ක් දින 8 සිට දින 18 දක්වා ප්‍රමාද වී ප්‍රේෂණය කර තිබුණි.
		(ii) 2017 වර්ෂයේ ජූලි සිට දෙසැම්බර් දක්වා සේවකයකුගේ අර්ථසාධක දායක මුදල් රු.36,740 ක් 2020 ඔක්තෝබර් 20 දින දක්වාත් ප්‍රේෂණය කර නොතිබුණි.
(ඈ)	2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 ඡේදය	පදනම විසින් ඉදිරි වර්ෂයන් සඳහා සංයුක්ත සැලැස්මක් ඉදිරිපත් කර නොතිබුණි.
(ඉ)	2010 සැප්තැම්බර් 06 දිනැති අංක 19 දරන අතිරේකයෙන් සිදුකරන ලද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 9.3.1(ආ) ඡේදය	රු.200,000 ක් ඉක්මවන වාහන අලුත්වැඩියා සම්බන්ධව අමාත්‍යාංශ ලේකම්ගේ පුද්ගලික අනුමැතිය ලබාගත යුතු වුවත් එබඳු අනුමැතියක් ලබානොගෙන රු.502,373 ක් වැයකර වාහනයක් අලුත්වැඩියා කර තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර පදනමේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

	බලතල, කර්තව්‍ය, කාර්යයන්	නිරීක්ෂණ
(i)	සාංගමික සංස්ථා පත්‍රය 3.3 හා 3.5 ඡේද	සී/ස සී-නෝර් පදනම අයිස් නිෂ්පාදනය, සාගර නිෂ්පාදන පැකට් කිරීම, විකුණුම්කරණය සහ අපනයනය, මසුන් දැල් නිෂ්පාදනය කිරීම සහ බෝට්ටු නිෂ්පාදනය හා බෙදාහැරීම යන කටයුතුවල නිරත විය යුතු වුවත් ඉන් බැහැරව බෝට්ටු නිෂ්පාදනය පමණක් සිදුකර තිබුණෙන් පදනම පිහිටුවීමේ පරමාර්ථවලින් බැහැරව කටයුතු කරන බව නිරීක්ෂණය විය.
(ii)	සාංගමික ව්‍යවස්ථාවලියේ 53 ඡේදය	වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්විය යුතු බව දක්වා තිබුණ ද 2018 සහ 2019 වර්ෂවල එකී මහා සභා රැස්වීම් පවත්වා නොතිබුණි.
(iii)	සාංගමික ව්‍යවස්ථාවලියේ 58 ඡේදය	වාර්ෂික මහා සභා රැස්වීමේ දී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් විසින් පදනමේ සභාපතිවරයා පත්කළ යුතු වුවත් සභාපතිවරයා පත්කිරීම ඒ අනුව සිදුකර නොතිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර පදනමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) 2015 සිට 2018 වර්ෂය දක්වා ගිවිසුමකට එළඹීමකින් තොරව ගැණුම්කරුවන්ගේ ඉල්ලීම පදනම් කරගෙන ගිලන්රථ බෝට්ටුවක්, පාලම් පාරුවක් හා දැල් ආම්පන්න නිෂ්පාදනය කර සැපයීමේ දී ගැණුම්කරුවන් ඒවා ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් සිදුවී තිබූ රු.25,035,238 ක අලාභය සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන ඔවුන්ට එරෙහිව 2019 දෙසැම්බර් 31 දින දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දී පදනමේ තත්‍ය නිෂ්පාදනය හා තත්‍ය ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා අඩු වූ අතර නිෂ්පාදන පිරිවැය සියයට 107 කින් ද පරිපාලන වියදම් සියයට 13.35 කින් ද හා අනෙකුත් වියදම් සියයට 473 කින් වැඩිවී තිබුණ ද වියදම් පාලනය කර ආදායම් ඉහල නංවා ගැනීම සඳහා කළමනාකරණය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) 2009 ජනවාරි 01 දිනට රු.940,000කට මිළට ගත් ලියවන පට්ටල් උපකරණයක් (Lathe machine) උපරිම ධාරිතාවයෙන් ප්‍රයෝජනයට ගැනීම සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොසිටිය දී 2012 වර්ෂයේ දී රු.1,658,705 ක් වැයකර තවත් එවැනි උපකරණයක් මිලදී ගෙන කිසිදු ප්‍රයෝජනයකට ගැනීමකින් තොරව නිෂ්ක්‍රීයව ගබඩා කර තිබුණ ද 2019 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 10 ක් තිස්සේ ඊට වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඈ) 2012 අගෝස්තු 20 දින රු.5,395,137 කට මිලට ගෙන තිබුණු ජෙල්කෝට් ස්ප්‍රේගන් යන්ත්‍රයක් වසර 07 කට අධික කාලයක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්ක්‍රීයව තිබුණි.

(ඉ) 2013 මාර්තු 05 දින රු. 4,166,964 කට මිලට ගෙන තිබුණු ප්ලාස්මා කැපුම් යන්ත්‍රය (Plasma Cutter Machine) වසර 06 කට අධික කාලයක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යව අනාරක්ෂිතව ගබඩාකර තිබුණි.

(ඊ) අංක IMUL - A- 0061 – KMN දරණ යාත්‍රාව සඳහා ගිවිසුම් ප්‍රකාරව ගෙවිය යුතු වටිනාකමට වඩා වැඩිපුර රු.3,264,560 ක් ගෙවා තිබූ අතර යාත්‍රාව සඳහා වූ ජෙනරේටරය වෙනුවෙන් රු.630,632ක් ගෙවීම් කර තිබුණද, 2020 දෙසැම්බර් 31 දින වන විටත් එම ජෙනරේටරය යාත්‍රාවට සවිකර නොතිබුණි. ගිවිසුමෙහි 2 වන කොන්දේසිය ප්‍රකාරව යාත්‍රාව අවසන් කර 2016 දෙසැම්බර් 15 දින හෝ ඊට පෙර ප්‍රතිලාභියා වෙත භාරදිය යුතු වුවත්, වර්ෂ 03 කට ආසන්න කාලයක ප්‍රමාදයක් තිබුණද යාත්‍රාවෙහි නිර්මාණය කර පැවතියේ හල් (hull) එක පමණක් වන අතර එය සමස්ත වැඩ වටිනාකමින් සියයට 18 ක් පමණි. තවද විධිමත්ව කොන්ත්‍රාත්තුවේ කාලය දීර්ඝ කර ගැනීමක් ද සිදු කර නොතිබුණි.

(උ) 2017 වර්ෂයේදී වැඩ ආරම්භ කළ බහුදින ධීවර යාත්‍රා දෙකෙහි කෙරීගෙන යන වැඩ ලෙස රු.30,321,342 ක වටිනාකමක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති නමුත් මෙම යාත්‍රා දෙකෙහි නිෂ්පාදන කටයුතු අවසන් කර ධීවර යාත්‍රා භාවිතයට අදාල පාර්ශවයන්ට ලබා දීමට කටයුතු කර නොතිබුනි.

03. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) 2008 සිට 2017 වර්ෂයන්ට අදාලව පැවත එන එකතුව රු.3,030,118ක් වූ ගෙවිය යුතු රඳවාගැනීම් මුදල් ශේෂය (Retention Payable) හා 2017 වර්ෂයේ සිට පැවත එන රු.27,688,325 ක් වූ විකුණුම් අත්තිකාරම් ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2013 සිට 2018 වර්ෂයන්ට අදාලව පැවත එන එකතුව රු.8,878,273 ක ලැබිය යුතු අත්තිකාරම් ශේෂය ද, 2011 වර්ෂයේ සිට යිවර අමාත්‍යාංශයෙන් අයවිය යුතු රු.3,527,824ක ශේෂය ද අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) 2011 වර්ෂයේදී පුද්ගලික ආයතනයකට මාළු දැල් නිපදවීම සඳහා ලබා දී තිබූ රු.4,909,775 ක අත්තිකාරම් ද, සැපයුම්කරුවන්ට වෙත ලබා දී තිබූ අත්තිකාරම්වලින් වර්ෂ 1සිට වර්ෂ 5 දක්වාවූ රු.4,367,309ක ශේෂය ද, වර්ෂ 05 ඉක්ම වූ රු.4,524,855ක ශේෂය ද අයකර ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ඈ) 2006, 2011 හා 2012 වර්ෂවල සිට පැවත එන දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.7,412,259 ක බදු මුදල අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේ අනෙකුත් ආදායම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඉ) 2017 වර්ෂයේ දී මොරිෂස් රාජ්‍ය සඳහා නිෂ්පාදනය ආරම්භ කර තිබුණු වටිනාකම රු.34,225,000 ක්වූ යාත්‍රාවෙහි නිෂ්පාදන කටයුතු 2019 දෙසැම්බර් 31 වන විටත් අවසන් කර නොතිබුණු අතර එදිනට පිරිවැය රු.9,096,352ක් වී තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

සමස්ථ ආදායම් ප්‍රකාශය

2019 වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනට

	සටහන	2019 (රුපියල්)	2018 (රුපියල්)
අඛණ්ඩ මෙහෙයුම්			
ආදායම	3	58,178,458.05	222,490,308.69
විකුණුම් පිරිවැය	4	(52,408,000.08)	(203,144,250.20)
දළ ලාභය / (පාඩුව)		**5,770,457.97**	**19,346,058.49**
ඉදිකිරීම් සහ වෙළඳ කටයුතු වලින් ලැබූ දළ ලාභය	5	7,581,774.35	(10,018,220.65)
අනෙකුත් මෙහෙයුම් ආදායම	6	30,610,822.05	(1,158,421.15)
විකුණුම් හා බෙදාහැරීමේ වියදම්	7	(6,576,205.29)	(4,157,480.71)
පරිපාලන වියදම්	8	(60,582,785.76)	(59,575,752.96)
අනෙකුත් මෙහෙයුම් වියදම්	9	(2,404,993.59)	(802,654.23)
මෙහෙයුම් ලාභය		**(25,600,930.27)**	**(56,366,471.21)**
මූල්‍ය ආදායම	10	2.702,796.78	6,514,744.09
අඛණ්ඩ මෙහෙයුම් වලින් ලැබූ බදු පෙර ලාභය		**(22,898,133.49)**	**(49,851,727.12)**
ආදායම් බදු වියදම්	11	(876,092.35)	-
අඛණ්ඩ මෙහෙයුම් වලින් ලැබූ බදු පසු ලාභය		**(23,774,225.84)**	**(49,851,727.12)**
අත්හිටුවනු ලැබූ මෙහෙයුම්			
වර්ෂයේ අත්හිටුවනු ලැබූ මෙහෙයුම් වලින් ලැබූ බදු පසු ලාභය		-	-
වර්ෂයේ ලාභය		**(23,774,225.84)**	**(49,851,727.12)**

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

2019 වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනට

	සටහන	2019 (රුපියල්)	2018 (රුපියල්)
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල, යන්ත්‍ර හා උපකරණ	12	430,244,414.35	294,930,251.53
ශ්‍රී බංග්ලා බෝට්ටු ආයෝජනය		1,961,850.00	1,961,850.00
		432,206,264.35	**296,892,101.53**
ජංගම වත්කම්			
තොග	13	109,084,946.90	76,653,398.35
සීමාසහිත නෝත්සි සමාගම		9,204,498.31	9,204,498.31
වෙළඳ ණයගැතියෝ	14	16,009,155.95	15,431,448.48
කාර්යමණ්ඩල ණයගැතියෝ	15	8,968,632.93	11,713,540.42
අනෙකුත් ලැබීම්	16	33,173,102.26	34,603,853.16
ඉල්ලුම් තැන්පතු		5,000.00	-
ස්ථාවර තැන්පතු		13,169,713.39	12,000,000.00
බැංකු හා මුදල්	17	17,133,598.63	45,857,849.48
		206,748,648.63	205,464,588.20
මුළු වත්කම්		**638,954,913.72**	**502,356,689.73**
ස්කන්ධය හා වගකීම්			
ස්කන්ධය			
ප්‍රකාශිත ප්‍රාග්ධනය		40,000,000.00	40,000,000.00
ආදායම් සංචිත		260,559,447.73	260,559,447.73
ප්‍රාග්ධන සංචිතය		62,601,030.04	62,601,030.04
රඳවාගත් ලාභය / (අලාභය)		(37,254,061.52)	(8,644,508.68)
මුළු ස්කන්ධය		325,906.416.25	354,515,969.09
ජංගම නොවන වගකීම්			
අමාත්‍යාංශ ප්‍රධාන	18	2,078,392.40	2,078,392.40
විලම්භිත වගකීම්	19	171,331,203.12	32,977,820.98
ණයගැනීමේ පොලී	20	-	-
		173,406,595.52	**35,056,213.38**

ජංගම වගකීම්

ණයගැනීමේ පොලී	21	-	1,356,722.83
වෙළඳ ගැතියෝ	22	43,834,058.88	39,681,128.30
අනෙකුත් ගෙවිය යුතු	23	90,674,717.72	71,746,656.47
ගෙවිය යුතු ආදායම් බදු	24	-	(0.34)
විලම්භිත ආදායම් බදු වගකීම	24.1	5,130,125.35	-
		139,638,901.95	112,784,507.26
මුළු වගකීම්		**313,048,497.47**	**147,840,720.64**
මුළු ස්කන්ධය හා වගකීම්		**638,954,913.72**	**502,356,689.73**

ස්කන්ධයන්ගේ වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය

2019 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා

	කොටස් ප්‍රාග්ධනය (රු.)	ප්‍රාග්ධන සංචිත (රු.)	ප්‍රත්‍යාගනන සංචිත (රු.)	සමුච්චිත ලාභය / (අලාභය) (රු.)	මුළු ස්කන්ධය (රු.)
2018 ජනවාරි 01 වන දිනට ශේෂය	40,000,000.00	62,601,030.04	260,559,447.73	41,207,218.44	404,367,696.21
වර්ෂයේ ශුද්ධ අලාභය	-	-	-	(54,687,054.12)	(54,687,054.12)
2018 දෙසැම්බර් 31 වන දිනට ශේෂය	**40,000,000.00**	**62,601,030.04**	**260,559,447.73**	**(13,479,835.68)**	**349,680,642.09**
වර්ෂයේ ශුද්ධ අලාභය	-	-	-	(23,774,225.84)	(23,774,225.84)
2019 දෙසැම්බර් 31 වන දිනට ශේෂය	**40,000,000.00**	**62,601,030.04**	**260,559,447.73**	**(37,254,061.52)**	**325,906,416.25**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2019 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය

(සියලු අංක රුපියල් වලිනි)	**2019**	**2018**
මෙහෙයුම් ක්‍රියාකාරිත්වයෙන් ලැබූ මුදල් ප්‍රවාහය		
බදුවලට පෙර ලාභය	(22,898,133.49)	(49,851,727.12)
එකතු කළා :		
ක්ෂය කිරීම්	12,022,333.28	12,886,021.01
පාරිතෝෂික වෙන් කිරීම්	6,651,313.45	3,047,299.50
කාරක ප්‍රාග්ධන වියදම් වලට පෙර මෙහෙයුම් ලාභය	**(4,224,486.76)**	**(33,918,406.61)**
තොගවල අඩු කිරීම්/ වැඩි කිරීම්	(32,431,548.55)	34,222,649.17
වෙළඳ හා අනෙකුත් ලැබීම් වල අඩු කිරීම් / වැඩි කිරීම්	3,597,950.92	(12,252,333.83)
වෙළඳ හා අනෙකුත් ගෙවීම් වල අඩු කිරීම් / වැඩි කිරීම්	23,080,989.67	(897,793.86)
විලම්භීත ආදායම් අඩු කිරීම් / වැඩි කිරීම්	133,272,016.19	(6,332,916.80)
මෙහෙයුම් ක්‍රියාවලින් උත්පාදනය කල මුදල්	123,294,921.47	(19,178,801.93)
අඩුකලා :		
ආයෝජන ආදායම්	(2,702,796.78)	(6,514,744.09)
ආදායම් බදු ගෙවීම්	0.34	(674,994.00)
පාරිතෝෂික ගෙවීම්	(1,569,947.50)	(1,390,705.00)
මෙහෙයුම් ක්‍රියාවලින් උත්පාදනය කරන ලද දළ මුදල්	**119,022,177.53**	**(27,759,245.02)**
ආයෝජන ක්‍රියාවලින් ලද මුදල් ප්‍රවාහ		
දේපළ යන්ත්‍ර උපකරණ මිලට ගැනීම් / විකිණීම්	(147,336,496.75)	(1,093,810.04)

ආයෝජන ආදායම්	2,702,796.78	6,514,744.09
කෙටි කාලීන ණය	-	-
ආයෝජන ක්‍රියා වලට යෙදූ ශුද්ධ මුදල්	**(144,633,699.97)**	**5,420,934.05**
මූල්‍ය කටයුතු වලින් ජනිත වුන මුදල් ප්‍රවාහ		
කල්බදු හිමියන්ට ගෙවීම්	(1,356,720.68)	(1,487,795.31)
මූල්‍ය ක්‍රියාකාරීත්වයන් සඳහා යෙදූ මුදල	**(1,356,720.68)**	**(1,487,795.31)**
මුදල් හා මුදල් සමාන වත්කම් වල මුලු වැඩිවීම්	**(26,968,243.12)**	**(23,826,106.28)**
සටහන A		
මුදල් සහ මුදලට සමාන ආරම්භක ශේෂය	57,857,849.48	81,683,956.54
සටහන B		
කාල පරිච්ඡේදය අවසාන මුදල් සහ මුදලට සමාන ශේෂය	**30,889,606.36**	**57,857,850.26**
	A සටහන	**B සටහන**
මහජන බැංකුව රැජින වීදිය ශාඛාව - 87847	134,214.23	177,181.76
හැටන් නැෂනල් බැංකුව - 16031	2,388,767.56	3,428,507.17
හැටන් නැෂනල් බැංකුව - 10002143	26,823.58	26,823.58
පෑන් ඒෂියා බැංකුව - 135670117	2,941.80	2,941.80
සුළු මුදල් අග්‍රිමය	142,000.00	102,000.00
ඉන්ධන අග්‍රිමය	55,000.00	28,000.00
ලංකා බැංකුව - 72322913	16,915,987.32	44,076.26
ලංකා බැංකුව කොළඹ ශාඛාව - 1450	26,192,114.99	13,324,068.06
ස්ථාවර තැන්පතු	12,000,000.00	13,169,713.39
	57,857,849.48	**30,303,312.02**

2019 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන වල සටහන්

01. සංයුක්ත තොරතුරු

1.1 පිහිටීම හා නීතිමය තත්ත්වය

සීමාසහිත සීනෝර් පදනම ශ්‍රී ලංකාව තුල සංස්ථාගත කළ සමාගමකි. ලියාපදිංචි කාර්යාලය අංක 335, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10 යන ස්ථානයේ පිහිටා ඇති අතර ප්‍රධාන බෝට්ටු යාත්‍රාංගනය මට්ටක්කුලිය ප්‍රදේශයේ පිහිටා ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයවීම්

රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවල ඇණවුම් වලට අනුව යාත්‍රාංගනයේ නිෂ්පාදනය කරන ලද යාත්‍රා සහ භාණ්ඩ අලෙවිය සහ අනෙකුත් ධීවර ආම්පන්න මිලදී ගැනීම සහ අලෙවි කිරීම් ලෙස සඳහන් කල හැක.

1.3 ව්‍යවසායිකත්වයේ අයිතිය

පූර්ණ රජය සතු සමාගමකි.

සේවක සංඛ්‍යාව

වර්ෂය අවසාන වන විට සමාගමේ සේවක සංඛ්‍යාව 73 ක් විය.

02. වැදගත් ගිණුම් ප්‍රතිපත්තිවල සාරාංශය

2.1 සාමාන්‍ය ප්‍රතිපත්ති

2.1.1 සැකසීමේ පදනම

2019 දෙසැම්බර් 31 වන දිනට අවසන් වූ වර්ෂය සඳහා වන සමාගමේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සමස්ථ ආදායම් ප්‍රකාශනය ව්‍යාපාර වස්තු කොටස් අයිතිය සහ මුදල් ප්‍රවාහ සහ ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන් (මූල්‍ය ප්‍රකාශන) ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන් සමග අනුගත වේ.

ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇති මෙම මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන උද්ධමනකාරී සාධක වල බලපෑම් වලින් තොරව සකස් කර ඇත.

2.1.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති වල වෙනස්වීම් සහ සංශෝධනය කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති සමග අනුගත වීම.

වර්ෂය තුල නව සහ සංශෝධිත ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන් අනුගමනය කිරීම.

පෙර වර්ෂවල අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මේ වර්ෂයේ ද නොවෙනස්ව පැවතින.

2.1.3 සංසන්දනාත්මක තොරතුරු

සමාගම විසින් ප්‍රමාණවත් පරිදි යොදාගත් ගිණුම් ප්‍රතිපත්ති පෙර වර්ෂයේදී යොදාගත් ගිණුම් ප්‍රතිපත්ති වලට අනුකූල වේ. පෙර වර්ෂයේ වාර්තා වුණු සංඛ්‍යා හා වාක්‍යයන් මෙම වාර්තා වලට උචිත වන පරිදි නැවත සකස් කර ඇත.

2.1.4 විදේශ මුදල් ගණුදෙනු

සියලුම විදේශ විනිමය ගණුදෙනු සිදුවන අවස්ථාවේදී පැවැති විදේශ විනිමය අනුපාතිකයට අනුව ශ්‍රී ලංකා රුපියල් වලට මාරු කරනු ලැබේ. විදේශ මුදල් ඒකක වලින් දක්වා ඇති මූල්‍ය වත්කම් සහ බැරකම් වර්ෂය අවසානයේ පැවැති විදේශ විනිමය අනුපාතිකයන්ට අනකූල වන සේ ශ්‍රී ලංකා රුපියල් වලට වර්ෂ අවසානයේ පැවැති ස්ථානීය විනිමය අනුපාතිකයට අනුකූල වන සේ නැවත ආගණනය කරනු ලැබේ. මෙහි ප්‍රථිපලයක් වශයෙන් අත්කරගත් ලාභය හෝ අලාභය ආදායම් ප්‍රකාශනයට ඇතුලත් කර ඇත.

2.1.5 බදුකරණය

වත්මන් බදු

ආදායම් බදු සඳහා වන ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති ආකාරයට 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ විධි විධානයන්ට අනුකූල වන සේ ගණනය කර සමාගමට අදාල කර ගතයුතු අනුපාතිකයට අනුව සිදු කර ඇත.

2.1.6 ශේෂ පත්‍රය දිනයට පසුව සිදු කළ ක්‍රියාකාරකම්

ශේෂපත්‍ර දිනයට පසුව සිදු කරන ලද සියලුම ප්‍රධාන ක්‍රියාකාරකම් සලකා බලන ලද අතර මූල්‍ය ප්‍රකාශන වල ඒ සඳහා අවශ්‍ය ගැලපීම් සිදු කොට ඇත.

2.1.7 ණය ගැණුම් පිරිවැය

කාල පරිච්ඡේදය තුළ දී ණය ගැනීම සඳහා වියදම ණය ගැණුම් පිරිවැය ලෙස සලකන ලදී.

2.2 වත්කම් තක්සේරු කිරීම හා ඒවා ගණනය කිරීමේ පදනම

2.2.1 භාණ්ඩ ලේඛන

භාණ්ඩ ගණනය කරනු ලබන්නේ ශුද්ධ උපලබ්ධි අගය හෝ අඩු වූ පිරිවැයෙන් අභාවිත හෝ හෙමින් නිකුත් වන භාණ්ඩ වල වටිනාකම් ගැලපීමෙනි. සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී විකිණීම සිදු කරන්නේ භාණ්ඩ නිම කිරීමේ පිරිවැය ගැලැපීමෙන් ලැබෙන ශුද්ධ උපලබ්ධි වටිනාකමය. වර්තමාන ස්ථානයට මෙම භාණ්ඩ තොගය ගෙන ඒමේදී වැය වූ පිරිවැය සහ එහි තත්ත්වය පහත සඳහන් සූත්‍රය මගින් ගණනය කරනු ලැබේ.

අමුද්‍රව්‍ය - පළමු ලැබීම් පළමු නිකුත් කිරීම් මත සත්‍ය පිරිවැය

නිෂ්පාදිත නිමි භාණ්ඩ - සෘජු අමුද්‍රව්‍ය වල සත්‍ය පිරිවැය නිම කල භාණ්ඩ වල ප්‍රතිශතය අනුව සෘජු ශ්‍රමය හා ස්ථාවර පොදු කාර්යයයෙන් අදාල පිරිවැය

නොනිමි භාණ්ඩ -සෘජු අමුද්‍රව්‍ය වල සත්‍ය පිරිවැය නිම කල භාණ්ඩ වල ප්‍රතිශතය අනුව සෘජු ශ්‍රමය හා ස්ථාවර පොදු කාර්යයෙහි අදාල පිරිවැය

මිලදී ගත් නිමි භාණ්ඩ - පළමු ලැබීම් පළමු නිකුත් කිරීම් මත සත්‍ය පිරිවැය

අනෙකුත් තොග - පළමු ලැබීම් පළමු නිකුත් කිරීම් මත සත්‍ය පිරිවැය

2.2.2 මූල්‍ය වත්කම්

(අ) වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ මුලදී මිලට පිළිගනු ලැබේ. සියලු විකුණුම් සාමාන්‍ය ණයවර නියමයන් මත කරනු ලබන අතර ලැබිය යුතු දේ සඳහා කිසිඳු පොළියක් අය නොකෙරේ. සෑම වාර්තා කිරීම් කාල වකවානුවේ අවසානයේදී මුදල් අයකර ගත නොහැකි බවට බාහිර සාක්ෂි තිබේද යන්න තීරණය කිරීමට වාණිජ ධාරණ මුදල් සහ වෙනත් අයවිය යුතු දේ පරීක්ෂා කරනු ලැබේ. එසේ ඇතිනම් ලාභ හෝ අලාභ හානි කරන අලාභයක් සඳහා ගනී.

මුදල් සහ මුදල් සමාන වත්කම් අතැති මුදල් ඉල්ලුම් තැන්පතු සහ කෙටිකාලීන ද්‍රව්‍යශීලීතාවයෙන් අග්‍ර ආයෝජන ක්ෂණිකව මුදල් බවට පත් කල හැකි දේ වන අතර වටිනාකම කිසිම විදියේ අවදානමකට භාජනය නොවන්නකි. මුදල් ප්‍රවාහ ප්‍රකාශන වලට ඇතැම් මුදල් සහ බැංකු තැන්පතු අයිරාවල ශුද්ධ හිග මුදල්, කෙටිකාලීනව මෝරන ආයෝජනය වන අතර ඒවා මාස 3 ක් හෝ අත්පත් කරගත් දිනට අඩුනම් මුදල් සමාන වත්කම් ලෙස සළකනු ලබයි.

2.2.3 දේපළ පිරියත සහ උපකරණ

(අ) තක්සේරු පිරිවැය

සියළුම දේපළ පිරියත හා උපකරණ මූලික අවස්ථාවේ ගණනව කරනු ලබන්නේ පිරිවැයෙනි. දේපළ පිරියත හා උපකරණ වල පිරිවැය යනු වත්කම එහි වර්තමාන තත්ත්වයට සහ ස්ථානයට ගෙන ඒම සඳහා දරන ලද මිලදී ගැනීමේ හා ඉදිකිරීමට අදාළ සියලු වියදම් වේ.

දේපළ පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානිකරණ අගයට වඩා අඩු පිරිවැයෙන් මනිනු ලැබේ.

දේපළ පිරියත හා උපකරණ පසුකාලීනව දරණ ප්‍රාග්ධන වියදම් ලෙස හඳුනාගනු ලබන්නේ එම වියදම් මගින් මෙම වත්කම් වල ක්‍රියාකාරිත්වය වැඩිදියුණු වීමක් සහ ඒ හා බැඳුණු අනාගත ප්‍රථිපල ආයතනයට ගලා ඒමක් සිදු වනවානම් පමණි.

(ආ) ක්ෂය කිරීම්

දේපළ යන්ත්‍ර උපකරණ පැවතිය හැකි ජීව ආයු කාලය සලකා බලා ක්ෂය කිරීමට ක්ෂය වෙන් කිරීම් ගණනය කරනු ලැබේ. එක් එක් වත්කම් කොටස් ක්ෂය කිරීම් ප්‍රතිශතය පහත සඳහන් පරිදි සඳහන් කර ඇත.

ගොඩනැගිලි	-	20	අවුරුදු
යන්ත්‍ර උපකරණ	-	10	අවුරුදු
ගෘහ භාණ්ඩ උපකරණ	-	05	අවුරුදු
සුලු උපකරණ	-	05	අවුරුදු
කාර්යාල උපකරණ	-	05	අවුරුදු
මෝටර් රථ	-	04	අවුරුදු
පරිගනක	-	04	අවුරුදු
මෘදුකාංග	-	05	අවුරුදු
බෝට්ටු අච්චු	-	05	අවුරුදු
කර්මාන්ත උපකරණ	-	08	අවුරුදු
කුලී පදනම මත ලබා ගත් මෝටර් රථ	-	04	අවුරුදු

(ඇ) අධික ක්ෂය වෙන්කිරීම් සඳහා ගැළපීම

2020.07.03 වන දින පවත්වන ලද අධ්‍යක්ෂ සැසිවාරය සඳහා 342.2.4 යටතේ ඉදිරිපත් කරන ලද අධ්‍යක්ෂ පත්‍රිකාව යටතේ ලබා දී තිබූ අනුමැතියට අනුව අධික ක්ෂය වෙන්කිරීම නිසා ගිණුම්වල සිදු වී තිබූ වැරදි නිවැරදි කිරීම සිදු කර ඇත. ඒ අනුව පොදු වර්ෂයන් වලට අදාළ ගැළපීම් සිදු කරමින් සකස් කර ඇති සැසඳුම් ප්‍රකාශ වලට අනුව පහත සඳහන් පරිදි වත්කම් වල අගයන් නිවැරදි කර ඇත.

	Rs.
ගොඩනැගිලි	218,749.25
යන්ත්‍ර සූත්‍ර	1,144,121.95
කර්මාන්තශාලා උපකරණ	135,729.65
කාර්යාලීය උපකරණ	500,555.56
පරිගණක	75,532.36
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	1,207,040.80
මෙවලම් සහ උපකරණ	746,173.38
ට්‍රැක්ටර් සහ ට්‍රේලර්	166,695.52
බෝට්ටු අව්වු/ ධීවර යාත්‍රා	249,097.92
මෝටර් රථ/ වාහන	948,470.56

(ඇ) මූල්‍ය නොවන වත්කම් හානිකරණය

සෑම වාර්තා කිරීමේ දිනට එවැනි වත්කම් හානිකරණයට ලක් වී ඇති බවට කිසිඳු සාක්ෂියක් ඇත්දැයි තීරණය කිරීමට දේපළ පරීක්ෂා කරනු ලැබේ. සිදුවිය හැකි හානිය පිළිබඳ ඇගවීමක් තිබෙනම් අදාළ වත්කමේ (හෝ අදාළ වත්කම් කාණ්ඩයේ) අය කර ගත හැකි අගය තක්සේරු කරනු ලබන අතර එහි ධාරණ අගයට සසඳනු ලැබේ.

නිමිත අයකර ගත හැකි අගය නම් ධාරණ අගය එහි නිමිත අයකර ගත හැකි අගයට අඩු කරනු ලබන අතර හානිකරණ අලාභයත් හඳුනාගත හැකි විස්තීර්ණ ආදායමේ ප්‍රකාශනයට ඇතුලත් කරනු ලැබේ.

සමාගමේ වත්කම් සෑම ක්‍රියාත්මක දිනයකදීම ඒවායේ හානිකරණ තත්වය ගැන දැන ගැනීමට හැකි වේ. එසේ හානිකරණ තත්ත්වයක් ඇත්නම් වාර්ෂික හානිකරණ තත්ත්වය සොයා බැලීමේ පරීක්ෂණයකදී එම වත්කම් වලින් ආපසු ලබා ගත හැකි වටිනාකම ගැන තක්සේරුවක් කරනු ලැබේ. එම වත්කම් වලින් ලබා ගත හැකි වටිනාකම එම වත්කම සාධාරණ තක්සේරු වටිනාකමින් විකුණුම් පිරිවැය අඩුකල විට එම වටිනාකමේ අගය තීරණය කරනු ලැබේ. එම වත්කම් වටිනාකම ලබාගත හැකි වටිනාකමේ හානිකරණය ගැන සලකා බලා අයකරගත නොහැකි වටිනාකම ලියා හරිනු ලැබේ.

එම වත්කමේ භාවිත වටිනාකමින් ලැබෙන අනාගත මුදල් ප්‍රවාහය වත්මන් වටිනාකමට පෙර බදු වට්ටම් අනුපාතයෙන් වට්ටම් කලහොත් වත්කම් වෙළඳපොළේ වටිනාකමත්, වත්මන් මුදලේ වටිනාකමත් එම වත්කමේ දැරීමේ අවධානම ගැනත් දැනගත හැකිය.

ආදායම් ප්‍රකාශනයක හානිකර අලාභය හානිකරණ උපකරණවල හානිකර අලාභයට පෙර ප්‍රත්‍යාගණන සංචිතයට ප්‍රතිවිරුද්ධ ලෙස ගැලපිය යුතුය. සෑම වාර්තා කරන දිනට තක්සේරුවක් කරනු ලබන්නේ පෙරදී තක්සේරු කළ හානිකර අලාභය නොපැවතීම හෝ අඩුකර දැක්වීමය. පෙරදින හඳුනාගත්

හානිකර අලාභය, කීර්ති නාමය හැරුණුවිට වත්කමින් නැවත අයකරගත හැකි මුදල වැඩි වී ඇත්නම් වත්කමට ගලපනු ලැබේ. පෙර හඳුනාගත් හානිකර අලාභයට බලපෑමක් නොවේනම් වත්කමේ වැඩි වීමක් ලෙස හඳුනාගනු ලැබේ.

(ඉ) හානිකරන අලාභ සඳහා වෙන්කිරීම්

රු. 1,961,850.00 ක මුදලක් 2008 වර්ෂයේ සිට කෙටිකාලීන ආයෝජන යටතේ අවසන් ගිණුම් තුළ හඳුනාගෙන ඇත. ඵු අනුව එම ශේෂය සඳහා ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත 36 යටතේ හානිකරණ අලාභ වෙනුවෙන් වෙන්කිරීම් සිදු කිරීම 342 වන අධ්‍යක්ෂ මණ්ඩල සැසිවාරයේදී අනුමත කර ඇත.

2.3 වගකීම් හා වෙන්කිරීම්

2.3.1 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

(අ) නිෂ්චිත පාරිතෝෂික ප්‍රතිලාභ සැලසුම

පාරිතෝෂික දීමනා සැලසුම් කල ප්‍රතිලාභයකි. සමාගමට පාරිතෝෂික දීමනා පනතට අනුව ගෙවීමට හැකියාවක් ඇත. මෙම වගකීම දැරීම සඳහා ශේෂ පත්‍රයේ ඉදිරියට ගෙන ආ වෙන් කිරීමක් මුදල් වර්ෂයේ අවසානයේ ලබාගත් වැටුපෙන් වර්ෂයකට මාස භාගයක වැටුපට සමාන වන ලෙස සේවා කාලය ආරම්භයේ සිට අදාළ මුදල් වර්ෂය තෙක් ගණනය කර වෙන් කිරීම් සිදු කරයි. ඉදිරියට ගෙන ආ වෙන් කිරීම වර්ෂය ආරම්භයේ ඇති වෙන් කිරීමේ ශේෂයට ගලපා වෙනස ආදායම් ප්‍රකාශනයට ඇතුලත් කරනු ලැබේ.

$$\text{Gratuity charge for the year} = \frac{SR^n}{2}$$

$$\text{Gratuity provision at the end of the year} = m\,\frac{SR^n}{2}$$

Where,

m = Past no. of service including current year

S = Current monthly salary

$$R = \frac{(1+r)}{(1+d)} = \frac{(1+\text{Expected annual average salary increment rate expressed as a fraction})}{(1+\text{Discount rate expressed as a fraction})}$$

n = Expected future no. of years of service

1983 අංක 12 දරණ පනතේ වගන්ති වලට අනුකූලව වගකීම දැරිය යුත්තේ අඛණ්ඩ සේවා කාලය වර්ෂ 5 සම්පූර්ණ කිරීමෙන් පසුවය. පාරිතෝෂික වගකීම අරමුදල් ලැබීමක් හෝ සත්‍ය ගණනය කිරීමක් නොවේ. මෙම අයිතමය විලම්භීත වගකීමක් ලෙස ශේෂ පත්‍රයේ දක්වයි.

(ආ) නිශ්චිත දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක සහ සේවක භාරකාර අරමුදල්

නිශ්චිත දායකත්ව සැලසුම සේවා අර්ථසාධක අරමුදල සහ සේවාභාරකාරීත්ව අරමුදල අදාළ අණපනත් වල වගන්ති අනුව සියළුම සේවකයින් අර්ථසාධක අරමුදලේ සහ සේවාභාරකාරීත්ව අරමුදලේ දායකත්වයෙන් ආවරණය විය යුතුය.

සේවක අර්ථසාධක අරමුදල

අනුමත සේවක අර්ථසාධක අරමුදලට එක් එක් සේවකයාගේ වැටුපෙන් සහ සමාගම විසින් පිළිවෙලින් 12% ක් සහ 8% ක් වශයෙන් දායකත්වය දක්වනු ලැබේ.

සේවක භාරකාර අරමුදල

සේවක භාරකාර අරමුදල සඳහා සමාගම විසින් එක් එක් සේවකයාගේ වැටුපෙන් **3%** ක් වශයෙන් දායකත්වය දක්වනු ලැබේ.

2.3.2 මූල්‍ය වගකීම්

මූල්‍ය වගකීම් (ගණුදෙනු පිරිවැය ඇතුළත්ව) ගණුදෙනු වියදම් මත මූලිකව හඳුනාගනු ලැබේ. ගෙවිය යුතු දෑ සාමාන්‍ය ණය කාලසීමාව සඳහා ඇති බැඳීම් වන අතර ඒ සඳහා කිසිදු පොළියක් නැත.

2.3.3 ප්‍රාග්ධන යෙදවුම් හා අවිනිශ්චිත අවශ්‍යතා

ශේෂපත්‍ර දිනට ඇති ප්‍රාග්ධන යෙදවුම් හා අවිනිශ්චිත වගකීම් සියල්ල මූල්‍ය ප්‍රකාශනයේ සටහන් මගින් දක්වා ඇත. (සටහන **27**)

2.3.4 ප්‍රතිපාදන

අතීත සිදුවීම්වල ප්‍රථිපල ලෙස සමාගමට ඇති වර්තමාන බැඳියාව (නීත්‍යානුකූල හෝ සාධනීය) දරණ විට ප්‍රතිපාදනයන් ලෙස පිළිගනු ලබයි. තවද සමාගම විසින් වගකීම ඉටුකල යුතු අතර වගකීමේ අගය සඳහා විශ්වාසදායක තක්සේරුවක් කල හැකිය.
මෙම මුදල හඳුනාගනු ලබන්නේ වගකීම වටා ඇති අවදානම් හා අවිනිශ්චිතතාව සැලකිල්ලට ගෙන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වර්තමාන වගකීම ඉටු කිරීමට ලබා දියහැකි හොඳම තක්සේරුව ලෙසය.

(අ) බොල් හා අඩමාන ණය සඳහා වෙන් කිරීම්

2019 අගෝස්තු මස පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල සැසි වාරයේදී ලබා ගත් අනුමැතියට අනුව, දැනට පවතින බොල් සහ අඩමාන ණය සඳහා වෙන්කිරීම රු. 3,363,224.25 කින් වැඩි වී ඇත. මෙම වෙන්කිරීම් වසර 10 ට වඩා අධික කාලයක් පුරා නිරවුල් නොවූ ශේෂයන් සලකා බලමින් සිදු කර ඇත.

2.4 ආදායම් ප්‍රකාශය

2.4.1 ආදායම් හඳුනා ගැනීම

ආදායම වශයෙන් හඳුනාගනු ලබන ප්‍රමාණයට සමාගමට ගලා එන අඩමාන ආදායම හා ආදායමට සම්බන්ධ වන දරන ලද පිරිවැය හෝ දැරිය යුතු පිරිවැයේ විශ්වාසනීයත්වය ගණනය කිරීමයි.

(a) භාණ්ඩ විකිණීම

භාණ්ඩ විකුණුම් හඳුනාගනු ලබන්නේ සැලකිය යුතු අවදානම සහ භාණ්ඩ භාරකාරීත්වයේ වාසිය සමාගමෙන් ගැණුම්කරුවා වෙත නිකුත්වීමේ දී රඳවා නොගත් අයිතිය සම්බන්ධයෙන් වූ ආර්ථික සබැඳියාව හෝ විකිණූ භාණ්ඩයේ පාලනයයි.

(b) පොලිය

උපචිත පදනම මත පොලිය හඳුනාගනු ලැබේ.

(c) බදුකුලී ආදායම

උපචිත පදනම මත බදුකුලී හඳුනා ගනු ලැබේ.

(d) අනෙකුත් ආදායම්

අනෙකුත් ආදායම් උපචිත පදනම මත හඳුනාගනු ලැබේ. 2019 වර්ෂය තුළ පහත සඳහන් මාර්ගයන්ගෙන් රු. 30,610,822.05 අනෙකුත් මෙහෙයුම් ආදායම් ලෙස හඳුනාගෙන ඇත.

බදුකුලී ආදායම
ප්‍රවාහනය සහ හැසිරවීම
රාජ්‍ය ප්‍රධාන
දේශීය විකුණුම් සඳහා කොමිස්

(e) විවිධ ආදායම්

පහත සඳහන් ගැළපීම් හේතුවෙන් 2019 වර්ෂය සඳහා වන විවිධ ආදායම් ඉහළ ගොස් ඇත.

1. බදු (GST/NSL/Turn Over Tax/VAT WHT/WHT) මෙම අයිතමයන් ගෙවිය යුතු ශේෂයන් ලෙස පසුගිය වර්ෂයන් තුළදී හඳුනාගෙන ඇත. තවදුරටත් එම ශේෂයන් ආයතනයේ වගකීමක් නොවන්නේ, මෙවැනි ගෙවිය යුතු ශේෂයක් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ගෙවීමට නොමැති බව තහවුරු කරමින් වාර්තා කර ඇති බැවිනි.

2. ආයතන දෙකකින් ලැබුණු ශේෂ තහවුරු කිරීම් වලට අනුව රු. 855,604.60 ක් විවිධ ආදායම් ලෙස 2019 වසරේදී හඳුනාගෙන ඇත.

(f) ලාභ සහ පාඩු

ශුද්ධ ලාභ හා පාඩු දේපළ උපලබ්දියකදී යන්ත්‍ර උපකරණ ආදායම් ප්‍රකාශනයට ගනු ලබන්නේ අපහරණ වියදම් විකිණීමෙන් ලැබෙන මුදලින් අඩු කිරීමෙන් පසු, දේපළේ අගය ලෙස ගණන් ගනු ලබන්නේ අදාල දේපළෙහි උපලබ්දි වියදම් විකුණුම් වියදම් අඩු කිරීමෙනි. ප්‍රත්‍යාගණන සංචිත ගිණුමේ ඉතිරිවන ෂේෂය කෙලින්ම සමුච්චිත ලාභයට මාරු කරනු ලැබේ.

(g) රජයේ ප්‍රධාන

අදාල ප්‍රධානය ලැබෙන බවට සහ එම ප්‍රධානයට ඇතුලත් කොන්දේසි වලට අනුකූලව ආයතනය කටයුතු කරන බවට සාධාරණ සහතිකයක් ඇත්නම්, එම ලැබීම් රාජ්‍ය ප්‍රධාන ලෙස හඳුනාගනු ලබයි. විලම්භීත ආදායමක් ලෙස හඳුනා ගන්නා වත්කම් වලට අදාල ප්‍රධානයන් එම වත්කම් ක්ෂය කරනු ලබන කාල පර්ච්ඡේදය තුල කාල සීමාවේ ලාභයට හෝ අලාභයට සමානුපාතිකව ගලපනු ලබයි.

2.4.2 වියදම් හඳුනා ගැනීම

ආදායම් ප්‍රකාශනයේ වියදමේ පදනම ලෙස හඳුනාගනු ලබන්නේ දරණ ලද පිරිවැයත් ඉපැයූ විශේෂිත අයිතමවල ආදායම අතර වෙනසකි. ව්‍යාපාරය කාර්යක්ෂමව පවත්වාගෙන යාමේදී දැරූ සියලු වියදම් සහ දේපළ යන්ත්‍ර නඩත්තුවට දැරූ වියදම් වර්ෂයේ ලාභය නිශ්චය කිරීම සඳහා ආදායම් ප්‍රකාශනයට මාරු කරයි.

2.4.3 ඇස්තමේන්තුගත අවිනිශ්චිතතාවයේ විවේචනාත්මක විනිශ්චයන් සහ ප්‍රධාන මූලාශ්‍ර

සමාගමේ මූල්‍ය ප්‍රකාශන සැකසීමේ දී, වාර්තා කිරීමේ දිනට ආදායමේ වාර්තාගත මුදල, වියදම්, වත්කම් සහ අනිශ්චිත වගකීම හෙළිකිරීම වැනි දේට බලපාන විනිශ්ච, තක්සේරු සහ උපකල්පන නිරීමට කළමනාකාරීත්වයට සිදු වේ.

සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශනයේ සටහන්

දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා	2019 (රුපියල්)	2018 (රුපියල්)
සටහන 3 - ආදායම්		
යාත්‍රා විකිණීම (දේශීයව)	58,178,458.05	222,490,308.69
අනෙකුත්	-	-
	58,178,458.05	**222,490,308.69**
සටහන 4 - විකිණුම් පිරිවැය		
ආරම්භක තොගය - අමුද්‍රව්‍ය	11,938,384.40	15,981,901.09
ආරම්භක තොගය - නොනිමි	44,296,992.56	85,855,038.72
ආරම්භක තොගය - නිමි	9,686,289.69	107,594.96
	65,921,666.65	**101,944,534.77**
එකතු කලා		
අමුද්‍රව්‍ය මිලට ගැනීම්	27,267,787.02	56,714,680.80
අනෙක් ද්‍රව්‍ය	10,012,930.20	42,333,374.72
එන්ජින්	5,396,304.35	15,903,023.61
	108,598,688.22	216,895,613.90
පියවීම් තොග - අමුද්‍රව්‍ය	(17,398,919.63)	(11,938,384.40)
පියවීම් තොග - නොනිමි	(77,818,313.82)	(44,296,992.56)
පියවීම් තොග - නිමි	(4,707,600.67)	(9,686,289.69)
පාවිච්චි කල අමුද්‍රව්‍ය පිරිවැය	**8,673,854.10**	**150,973,947.25**
එකතු කලා : සෘජු වියදම්		
වැටුප් හා වේතන	9,105,016.94	8,593,153.04
දීමනා - සෘජු	2,301,461.64	3,006,105.65
අතිකාල - සෘජු	190,362.14	623,142.20
සේවක අර්ථසාධක අරමුදල - සෘජු	1,092,602.03	1,031,178.36
සේවක භාරකාර අරමුදල - සෘජු	273,150.51	257,794.59
පාරිතෝෂික - සෘජු	-	2,206,321.00
උප කොන්ත්‍රාත් වියදම්	14,390,789.73	23,135,776.78
පරීක්ෂණ සහ තත්ත්ව පාලන	-	-
ප්‍රාථමික පිරිවැය	**36,027,237.09**	**189,827,418.87**

එකතු කලා : නිෂ්පාදන පොදු කාර්ය

වැටුප් හා වේතන	2,503,768.30	2,578,016.80
දීමනා	624,522.15	798,109.00
අතිකාල දීමනා	29,253.14	117,703.10
සේවක අර්ථසාධක අරමුදල	300,452.20	309,362.02
සේවක භාරකාර අරමුදල	75,113.05	77,340.50
ක්ෂය කිරීම්	10,309,450.09	7,053,395.35
විදුලිය	849,436.82	838,636.53
උපකරණ නඩත්තු කිරීම්	17,138.00	87,316.17
යන්ත්‍ර සූත්‍ර නඩත්තු කිරීම්	4,450.00	220,060.00
වාහන නඩත්තු කිරීම් - යාත්‍රාංගනය	32,132.00	77,846.30
කුලියට ගත් යන්ත්‍ර සූත්‍ර	-	141,450.00
පිරිසිදු කටයුතු - යාත්‍රාංගනය	706,507.00	211,340.00
ඉන්ධන හා ලිහිසි තෙල්	257,719.60	322,064.73
ජලය	311,535.64	423,940.83
වෙනත් වියදම් - යාත්‍රාංගනය	278,285.00	60,250.00
නිෂ්පාදිත පිරිවැය	**52,408,000.08**	**203,144,250.20**

සටහන 05 - වෙළඳ ක්‍රියාකාරීත්වයෙන් ලැබූ දළ ලාභය

විකුණුම්	35,225,223.98	16,341,962.66
(-) විකුණුම් පිරිවැය	(27,643,449.63)	(26,360,183.31)
වෙළඳ ක්‍රියාකාරීත්වයෙන් ලැබූ දළ ලාභය	**(7,581,774.35)**	**(10,018,220.65)**
	(7,581,774.35)	**(10,018,220.65)**

සටහන 06 - අනෙකුත් මෙහෙයුම් ආදායම

බදුකුලී ආදායම	15,346,372.59	16,515,882.36
උපදේශන සේවා	-	-
අවන්හලේ ආන්තික ලාභය	-	323,515.96
ප්‍රවාහනය සහ හසුරුවීම	1,423,904.61	1,655,620.18
රජයේ ප්‍රධාන	13,680,544.85	(19,667,083.20)
කොමිස්	160,000.00	-
වත්කම් බැහැර කිරීම මගින් ලැබීම්	-	13,643.55
	30,610,822.05	**(1,158,421.15)**

සටහන 07 - විකුණුම් බෙදාහැරීමේ වියදම්

ප්‍රවාහනය සහ හසුරුවීම	31,935.00	26,600.00
වාහන අලුත්වැඩියා සහ නඩත්තු කටයුතු	784,012.22	1,481,711.45
විකුණුම් ප්‍රවර්ධනය	46,239.00	197,874.00
විකුණුම් කොමිස්	1,150,594.17	116,446.10
විනෝදාස්වාද කටයුතු	-	17,760.00
පරිත්‍යාග හා තෑගි	374,750.00	20,000.00
ඉන්ධන හා ලිහිසි තෙල්	787,065.08	2,144,472.16
වෙළඳ ලියවිලි වියදම	34,060.57	80,500.00
මුද්දර බදු	3,575.00	4,775.00
ණයගැතියෝ	3,363,224.25	-
බෑමේ හා පැටවීමේ වියදම්	-	21,500.00
විකුණුම් / විරංජනය කිරීම හා ඇසිරීමේ පිරිවැය	750.00	-
ප්‍රදර්ශන වියදම්	-	45,842.00
	6,576,205.29	**4,157,480.71**

සටහන 08 - පරිපාලන වියදම්

වැටුප් හා වේතන	22,894,599.92	22,207,082.49
අතිකාල	896,479.99	1,788,194.83
දීමනා	3,705,379.98	4,314,677.14
සේවක අර්ථසාධක අරමුදල් ගෙවීම්	2,747,351.99	2,664,849.89
සේවක භාරකාර අරමුදල් ගෙවීම්	686,838.01	666,212.47
ප්‍රසාද දීමනා සහ දිරි දීමනා	402,390.00	-
පාරිතෝෂික දීමනා	6,651,313.45	840,978.50
දුරකතන වියදම්	805,131.01	712,758.03
සුභ සාධක වියදම්	1,574,632.00	1,060,450.56
තැපැල් වියදම්	49,505.00	32,075.00
කුරියර් වියදම්	6,750.00	2,936.00
ගොඩනැගිලි නඩත්තුව	98,406.50	108,884.00
පරිගණක නඩත්තුව	181,003.77	161,265.00
කාර්යාල උපකරණ නඩත්තුව	199,851.25	429,210.09

ජලය	198,854.13	201,231.20
විදුලිය	1,427,648.65	1,397,657.52
මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය වියදම්	1,578,529.11	1,061,412.69
දැන්වීම් පල කිරීමේ වියදම්	497,477.50	752,494.50
ක්ෂය කිරීම්	1,631,883.19	5,834,796.98
නීති වියදම්	321,560.00	511,630.00
රක්ෂණය	369,076.39	567,364.10
ආරක්ෂක වියදම්	4,726,352.00	5,518,096.00
අන්තර්ජාලය - විද්‍යුත් තැපැල් වියදම	220,380.01	447,798.15
වරිපනම් හා බදු	1,260,266.75	231,002.80
පවිත්‍ර කිරීම හා සනීපාරක්ෂක කටයුතු	463,161.00	621,138.00
වාහන කුලී	-	1,447,466.67
බලපත්‍ර හා ලියාපදිංචි කිරීම	151,638.92	233,419.22
විගණන ගාස්තු	1,046,500.00	185,000.00
අධ්‍යක්ෂ පරිශ්‍රමිකය	272,000.00	172,500.00
වෛද්‍ය වියදම්	663,350.00	709,415.00
පුහුණුවීම් හා සම්මන්ත්‍රණ	127,755.00	94,350.00
ආහාර හා නවාතැන් ගැනීම	205,335.00	79,645.18
අධිභාර දඩගැසීම් වියදම්	3,831,288.45	208,605.75
උත්සව/ සමාජ රැස්වීම් වියදම්	27,393.00	275,505.00
වියදම් - තත්ව සහතික	120,000.00	135,000.00
ලේකම් ගාස්තු	148,000.00	45,000.00
උපදේශන ගාස්තු	76,900.00	3,334,523.47
දේශීය ගමන් වියදම්	317,803.79	521,126.73
	60,582,785.76	**59,575,752.96**

<u>සටහන 09 - අනෙකුත් වියදම්</u>

බැංකු වියදම් හා කොමිස්	380,934.27	587,733.54
කල්බදු පොලී	62,209.32	214,920.69
හානිකරණ අලාභ	1,961,850.00	-
	2,404,993.59	**802,654.23**

සටහන 10 - මූල්‍ය ආදායම

පොලී ආදායම	2,702,796.78	6,514,744.09
	2,702,796.78	**6,514,744.09**

සටහන 11 - ආදායම් බදු වියදම්

කාලපරිච්ඡේදයට අදාළ බදු වියදම ලෙස පෙන්නුම් කරන්නේ වර්ථමාන බදු බැඳියාව හෝ විලම්භීත බදු වේ. ලාභ හෝ අලාභ මත බදු හඳුනාගන්නා අතර, වෙනත් විස්තීර්ණ ආදායමක් ලෙස පිළිගත් ආදායම් හෝ වියදම් අයිතමයකට ආරෝපණය කළ හැකි වෙනසක් හැර වෙනත් විස්තීර්ණ ආදායම් සෘජුවම හඳුනාගෙන ඇත.

(A) වර්ථමාන බදු

වත්මන් බද්ද යනු වාර්තා කරන දිනයේ දී පනවන ලද හෝ සැලකිය යුතු ලෙස පනවන ලද බදු අනුපාත සහ පෙර වසරවලට අදාළව ගෙවිය යුතු බදු සඳහා යම් ගැලපීමක් භාවිතා කරමින් වර්ෂය සඳහා බදු අය කළ හැකි ආදායම මත ගෙවිය යුතු අපේක්ෂිත බද්දයි. සමාගමේ බදු වගකීම ගණනය කර ඇත්තේ 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන සහ ඊට පසුව සිදු කළ සංශෝධන.

(B) විලම්භීත බදු

විලම්භීත බදු වත්කම් රැගෙන යන ප්‍රමාණය එක් එක් වාර්තාකරණ දිනයකදී සමාලෝචනය කෙරෙන අතර ඒවා පිළිබිඹු කිරීමට සකස් කරනු ලැබේ.

අනාගත බදු අය කළ හැකි ලාභයේ වර්තමාන තක්සේරුව ඕනෑම ගැලපීමක් ලාභයේ හෝ අලාභයේ හඳුනාගෙන ඇත. කල් දැමූ බද්ද ගණනය කරනු ලබන්නේ එය කල් දැමූ බදු වත්කම් සාක්ෂාත් කර ගැනීමට හෝ විලම්භීත බදු වගකීම අපේක්ෂා කරන කාල පරිච්ඡේදවල බදු අය කළ හැකි ලාභයට (බදු අලාභයට) අදාළ වීමට බලාපොරොත්තු වන බදු අනුපාතවලට අනුව ය. වාර්තාකරණ කාල සීමාව අවසන් වන විට පනවන ලද හෝ සැලකිය යුතු ලෙස පනවන ලද බදු අනුපාත මත පදනම්ව පියවිය යුතුය.

මූල්‍ය තත්ත්වය පිළිබඳ සටහන්

සටහන 12 - දේපළ හා යන්ත්‍ර උපකරණ සටහන

පිරිවැය / ප්‍රත්‍යාගණනය	2019 ජනවාරි 01 වැනි දිනට	එකතු කිරීම්	අපහරණය	2019 දෙසැම්බර් 31 වැනි දිනට
නිදහස් දේපළ				
ඉඩම්	250,000,000.00	-	-	250,000,000.00
ගොඩනැගිලි	33,256,916.85	146,952,561.04	-	180,209,477.89
යන්ත්‍ර සූත්‍ර	5,109,912.00	-	-	5,109,912.00
කර්මාන්තශාලා උපකරණ	4,767,195.41	38,294.01	-	4,805,489.42
කාර්යාල උපකරණ	3,548,539.92	15,710.87	-	3,564,250.79
පරිගණක	3,940,520.50	319,158.00	-	4,259,678.50
ගෘහ භාණ්ඩ හා සවි කිරීම්	3,520,099.66	10,772.83	-	3,530,872.49
සුළු උපකරණ	34,923,741.62	-	-	34,923,741.62
ටේලරය හා ට්‍රැක්ටරය	4,090,000.00	-	-	4,090,000.00
ධීවර යාත්‍රා හා බෝට්ටු අච්චු	31,631,229.95	-	-	31,631,229.95
මෝටර් රථ	18,686,902.57	-	-	18,686,902.57
වෙනත් වත්කම්				
පරිගණක මෘදුකාංග	10,193,454.00	-	-	10,193,454.00
	403,668,512.48	**147,336,496.75**	**-**	**551,005,009.23**

ක්ෂය කිරීම්	2019 ජනවාරි 01 වන දිනට ශේෂය	වර්ෂය තුල ක්ෂය කිරීම්	අපහරණය	2019 දෙසැම්බර් 31 වන දිනට ශේෂය
නිදහස් වත්කම්				
ගොඩනැගිලි	10,217,189.38	9,010,473.81	(218,749.25)	19,008,913.94
යන්ත්‍ර සූත්‍ර	3,731,874.02	510,991.20	(1,144,121.95)	3,098,743.27
කර්මාන්තශාලා උපකරණ	3,123,955.77	295,733.69	(135,729.65)	3,283,959.81
කාර්යාල උපකරණ	2,995,651.94	332,496.72	(500,555.56)	2,827,593.10
පරිගණක	3,154,269.80	374,616.14	(75,532.36)	3,453,353.58

මෙවලම් සහ උපකරණ	36,087,265.72	43,516.69	(1,207,040.80)	34,923,741.61
ගෘහ භාණ්ඩ හා සවි කිරීම්	3,463,563.60	219,190.18	(746,173.38)	2,936,580.40
බෝට්ටු අච්චු	16,494,130.91	4,396,056.24	(249,097.92)	20,641,089.23
ට්‍රැක්ටර් හා ට්ලර්	4,256,695.52	-	(166,695.52)	4,090,000.00
මෝටර් රථ	19,252,759.29	234,121.76	(948,470.56)	18,538,410.49
වෙනත් වත්කම්				
පරිගණක මෘදුකාංග	5,960,905.00	2,022,090.84	(24,787.04)	7,958,208.80
	108,738,260.95	**17,439,287.27**	**(5,416,953.99)**	**120,760,594.88**
ශුද්ධ පොත් අගය	**294,930,251.53**			**430,244,414.35**

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ සටහන්

2019 දෙසැම්බර් 31 වන දිනට	2019 (රුපියල්)	2018 (රුපියල්)
සටහන 13 – පරිලේඛන		
අමු ද්‍රව්‍ය	17,398,919.63	11,938,384.40
නොනිමි වැඩ	77,818,313.82	44,296,992.56
නිමි භාණ්ඩ හා මුහුදු යාත්‍රා	4,707,600.67	9,686,289.69
නිමි භාන්ඩ හා ධීවර උපකරණ	9,160,112.78	10,731,731.70
	109,084,946.90	**76,653,398.35**
සටහන 14 – වෙළඳ කටයුතු වලින් ලැබීම්		
වෙළඳ ණය ගැතියෝ	25,764,870.32	21,823,938.60
අඩුකලා බොල් ණය වෙන් කිරීම	(9,755,714.37)	(6,392,490.12)
	16,009,155.95	**15,431,448.48**
සටහන 15 - සේවක මණ්ඩලයේ ණය ගැතියෝ		
වැටුප් අත්තිකාරම්	6,446.89	6,446.89
උත්සව අත්තිකාරම්	58,454.52	61,628.59
සේවක මණ්ඩල ණය ගැතියෝ	8,903,731.52	11,645,464.94
	8,968,632.93	**11,713,540.42**
සටහන 16 - අනෙකුත් අයවිය යුතු ලැබීම්		
අමු ද්‍රව්‍ය සඳහා අත්තිකාරම්	115,463.35	115,463.35
වෙනත් අත්තිකාරම්	13,015,470.31	11,179,064.44
ලැබිය යුතු අනෙකුත් ලැබීම්	1,941,584.39	2,006,584.39
පෙර ගෙවුම් ආරක්ෂක සේවා බද්ද	-	2,466,894.26
උප කොන්ත්‍රාත්	4,909,775.05	4,909,775.05
ආපසු ලබා ගත යුතු තැන්පත්	599,112.76	770,402.76
දික්ඕවිට ව්‍යාපාරය ඉදිකිරීම්	1,770,766.18	1,770,766.18
දික්ඕවිට රඳවා ගැනීම් - LS	1,757,057.50	1,757,057.50
රඳවා ගැනීමේ බද්ද	3,414,811.88	2,485,142.02
සීනෝර් අවන්හලෙන් ලැබිය යුතු මුදල්	323,515.96	323,515.96
නඩු වලින් අපේක්ෂා කිරීම්	14,902.63	14,902.63
බැංකු ඇපවීම්	5,310,642.25	6,804,284.62
	33,173,102.26	**34,603,853.16**

සටහන 17 - මුදල් සහ බැංකු

ලංකා බැංකුව 1450	13,324,068.06	26,192,114.99
මහජන බැංකුව රැජින වීදිය 033 100 14 1790965	177,181.76	134,214.23
හැටන් නැෂනල් බැංකුව 16031	3,428,507.17	2,388,767.56
හැටන් නැෂනල් බැංකුව 10002143	26,823.58	26,823.58
පෑන් ඒෂියා බැංකුව 1356670117	2,941.80	2,941.80
ලංකා බැංකුව 72322913	44,076.26	16,915,987.32
සුළු මුදල් අග්‍රිමය	102,000.00	142,000.00
ඉන්ධන අග්‍රිමය	28,000.00	55,000.00
	17,133,598.63	**45,857,849.48**

ජංගම නොවන වගකීම්

සටහන 18 - අමාත්‍යාංශ ප්‍රධාන

බෝට්ටු අව්වු අත්තිකාරම් අඩි 55	20,000,000.00	20,000,000.00
අඩුකලා අවිනිශ්චිත - අඩි 55 අව්වු	(17,921,607.60)	(17,921,607.60)
	2,078,392.40	**2,078,392.40**

සටහන 19 - අනෙකුත් විලම්භීත නොවන බැරකම්

වර්ෂය ආරම්භයේ ශේෂය	15,750,911.00	14,094,316.50
එකතු කලා වර්ෂයට වෙන් කිරීම්		
පාරිතෝෂික - සෘජු	-	2,206,321.00
පාරිතෝෂික - පරිපාලන	6,651,313.45	840,978.50
	22,402,224.45	**17,141,616.00**
අඩුකලා වර්ෂය තුල ගෙවීම්	(1,569,947.50)	(1,390,705.00)
පාරිතෝෂික වෙන් කිරීම්	20,832,276.95	15,750,911.00
විලම්භීත ආදායම	150,498,926.17	17,226,909.98
	171,331,203.12	**32,977,820.98**

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ සටහන්

වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනට	2019 (රුපියල්)	2018 (රුපියල්)
සටහන 20 - ණයට ගැනීම්වල පොලී		
කල්බදු ණය හිමියෝ	-	-
අඩුකලා අවිනිශ්චිත පොලී	-	-
	-	-
ජංගම වගකීම්		
සටහන 21 - කලුබදු ණය හිමියෝ		
කල්බදු ණය හිමියෝ	-	1,418,932.15
අඩුකලා අවිනිශ්චිත පොලී	-	(62,209.32)
	-	**1,356,722.83**
සටහන 22 - වෙළඳ ණය හිමියෝ	43,834,058.88	39,681,128.30
	43,834,058.88	**39,681,128.30**
සටහන 23 - අනෙකුත් ගෙවිය යුතු දෑ		
සේවක අර්ථසාධක අරමුදල් 20%	1,107,769.68	494,819.22
සේවක භාරකාර අරමුදල් 3%	166,165.45	74,222.84
භාණ්ඩ හා සේවා මත බදු	-	650,625.86
තැන්පතු	40,584,516.95	40,531,516.95
මුද්දර බද්ද	6,350.00	6,750.00
ජාතික ආරක්ෂක බදු	-	1,691,290.75
ආරක්ෂක සේවා ගාස්තු - CFHC	1,144,306.45	1,144,306.45
රඳවාගැනීම් බදු	-	3,368,451.75
විකුණුම් බද්ද	-	243,597.89
එකතු අගය මත බදු/ රඳවාගැනීමේ බදු	-	1,458,292.91
එකතු අගය මත බදු	(19,702,720.16)	(17,585,187.84)
ජාතිය ගොඩනැගීමේ බදු	10,406,698.99	10,437,306.46

ESC	(4,166,355.82)	(866,788.47)
බැංකු ණය	17,619.33	69,965.64
වෙළඳ අත්තිකාරම්	53,936,018.15	27,688,325.31
රඳවා ගැනීමේ ගිණුම	3,451,068.30	3,239,368.30
සුභ සාධක සමිතිය	67,647.56	337,682.83
වෘත්තීය සමිති ගිණුම	650.00	6,250.00
වන්දි ගිණුම - යාපනය	118,569.63	118,569.63
ණයවර ලිපි ගාස්තු	-	(2,786,334.17)
වැටුප් පාලක ගිණුම	262,108.62	226,264.57
හිමිකම් නොපෑ - වැටුප් හා වේතන	331,154.91	256,329.91
හිමිකම් නොපෑ - පාරිතෝෂික	412,620.00	412,620.00
ගෙවීම් ලබන්නන්ගේ ගිණුම	200.00	19,930.00
අනෙකුත් ණය හිමියෝ	68,479.68	68,479.68
විගණකයන්ගේ දීමනා	500,000.00	440,000.00
හානිකරණ අලාභ	1,961,850.00	-
	90,674,717.72	**71,746,656.47**

<u>සටහන 24 - ගෙවිය යුතු ආදායම් බදු</u>		
ජනවාරි 1 දිනට ශේෂය	-	674,993.66
අඩුකලා වසර තුළ ගෙවීම්	-	(674,994.66)
වර්ෂයේ ආදායම් බද්ද	876,092.35	4,835,327.00
	876,092.35	**4,835,326.00**
<u>අඩුකලා - බදු බැර</u>		**(581,293.00)**
<u>සටහන 24. 1 - විලම්භිත බදු වගකීම්</u>	(876,092.35)	(4,254,033.00)
WHT ගෙවූ	-	-
ESC ගෙවූ		
2011/ 12	-	-

2012/ 13	-	-
2013/ 14	-	-
2014/15	-	-
2015/ 16	-	-
2016/17	-	-
ගෙවිය යුතු ආදායම් බදු	-	-

සටහන 25 - අඛණ්ඩ පැවැත්ම හෙළිදරව් කිරීම.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන සියල්ලම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති සඳහා අදාළ වන ශ්‍රී ලංකා වරලත් ගිණුම්කරණ ආයතනය මගින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත වලට අනුකූලව සකස් කර ඇත. සෑම වසරකම ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අඛණ්ඩව එම ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගෙන ඇති අතර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කර ඇති ඇගයීම් අනුව අපේක්ෂිත කළ හැකි අනාගත කාලයක් දක්වා ආයතනික කටයුතු කිසිදු බිඳවැටීමකින් තොරව පවත්වාගෙන යා හැකි බවට අපේක්ෂා කර ඇත.

සටහන 26 - රජයේ ප්‍රධාන

A. අදාළ වත්කම් වල ප්‍රයෝජනවත් ජීවිත කාලය වෙනුවෙන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වත්කමට අදාළ රජයේ ප්‍රතිපාදනයක් ලෙස හඳුනාගන්නා ලදී. මූල්‍ය වසරේදී වෙනත් මෙහෙයුම් ආදායම් යටතේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ රු. 13,680,544.85 ක් හඳුනාගන්නා ලදී.

සටහන 27 - අදාළ පාර්ශවයේ අනාවරණය කිරීම්

ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයට අනුබද්ධව ක්‍රියාත්මක වන සීමාසහිත සීනෝර් පදනම හට අමාත්‍යාංශය මගින් සහ එයට අනුබද්ධිත අනෙකුත් ආයතන වලින් ලබා දී ඇති ඇණවුම් මගින් රු. 35,739,660.52 ක මුදලක් 2019 වර්ෂය තුල උපයා ඇත.

සටහන 28 - වෙන් කිරීම් සහ විලම්භිත බැරකම්

A. සීමාසහිත සීනෝර් පදනම 2008 වර්ෂයේ බන්ග්ලාදේශයේ පිහිටි ශ්‍රී බංග්ලාස් බෝට්ටු පුද්ගලික ආයතනය සමග රු. 1,961,850.00 ක ආයෝජනයක් සහිතව ආරම්භ කරන ලද බෝට්ටු සෑදීම ව්‍යාපාරයෙහි අධ්‍යක්ෂ මණ්ඩලය සීනෝර් පදනමෙහි අධ්‍යක්ෂකවරයන් දෙදෙනෙකුගෙන්ද සමන්විත විය යුතු බව සඳහන් කර ඇත.

B. වර්ෂ 2019 තුළ දී සමාගම විසින් නිෂ්පාදනය කරන ලද ෆයිබර් බෝට්ටු සඳහා වගකීම් සහතික නිකුත් කිරීම සමාගමට විලම්භීත බැරකමකි. ආර්ථික වාසිය නැති වීම නිසා හෝ ජලය කාන්දු වීමේ ප්‍රවණතාවය නිසා හෝ මේ දක්වා වගකීම් සඳහා කිසිම ගණුදෙනුකරුවෙකු ඉල්ලුම් කර නැත.

සටහන 29 - ආයෝජන දේපළෙන් ලැබෙන ආදායම

සමාගම ආයෝජන ගණනය කිරීම සඳහා ආදර්ශ පිරිවැයක් යොදා ගන්නා ලදී. විශ්වාසනීයත්වය තීරණය කිරීමට සාධාරණ වටිනාකමකින් යුතු බදු ආදායමක් 2019 වර්ෂයට ලබා ගැනීමට ආයෝජන දේපළෙන් පහත දක්වා ඇති ක්‍රමයට ඇස්තමේන්තු කළ පිරිවැයක් යොදා ගන්නා ලදී.

ස්ථානය / අයිතමය	ගණන (රු)	කාලපරිච්ඡේදය
ජංගම වැඩහල්	646,372.89	ජනවාරි සිට දෙසැම්බර්
මට්ටක්කුලිය ඉඩම	12,000,000.00	මාර්තු සිට දෙසැම්බර්
ඩී. ආර්. විජේවර්ධන මාවතේ ඉඩම	0.00	ජනවාරි සිට දෙසැම්බර්
මත්තුමගල වැඩහල	2,700,000.00	ජනවාරි සිට දෙසැම්බර්
එකතුව	**15,346,372.89**	ජනවාරි සිට දෙසැම්බර්

සටහන 30 - සංචිත

සමාගම ස්වභාවයෙන්ම සුවිශේෂී නොවන සාමාන්‍ය ගණුදෙනු සිදු කරගෙන යන අතර එවිට එවැනි ගණුදෙනු වලින් ලැබෙන ලාභ හා අලාභ, වර්ෂයේ ආදායම් ප්‍රකාශ තුළ පෙන්වනු ලබයි. මෙසේ හඳුනාගන්නා ලාභ හා අලාභ වෙනුවෙන් වෙනම සංචිතයක් පවත්වා ගන්නා අතර ඒ මගින් කොටස් හිමියන්ට අදාළ බෙදාහැරීම් සිදු කරනු ලබයි.